// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1955/7 - 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා - 2016.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළකරනු ලබන නිවේදනය.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියෙහි 3 වන උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමැතිය ලබාදීමෙන් අනතුරුව, එකී අනුමැතිය පිළිබඳ වූ නිවේදනයත් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා විසින් පිළිගැනීමට බලය ලැබෙන බව මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 14 වැනි දින,
පල්ලේකැලේ,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) වගන්තිය යටතේ බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙහි විධිවිධාන අදාළ වන බලප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැළසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ ඉඩම් කොටස් සඳහා වන සැළසුම් පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සැළසීම පිණිස පනවනු ලබයි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් කොටස් සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි.

4. බල ප්‍රදේශය තුළ යම් ඉඩමක පොළව අභ්‍යන්තරයට හෝ පොළව මතුපිටට ඉදිකරනු ලබන සෑම ස්ථිර ඉදිකිරීමක්ම හා ඉදිකිරීමකට අදාළවන සෑම ඉඩම් කොටසක්ම නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූලව සභාපති විසින් අනුමත කරන ලද සැළැස්මකට අනුකූලවිය යුතු ය.

5. බල ප්‍රදේශය තුළ යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් සැළසුම් හා ඉඩම් කොටසකට හෝ ඉඩම් අනුබෙදුමකට අදාළ සැළැස්මක් අනුමත කර ගැනීම සඳහා 1953 අංක 53 දරන සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රයක් යටතේ අයදුම් කළ යුතු අතර, ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන ගාස්තුවක් ගෙවා ප්‍රාදේශීය සභාව වෙතින් අදාළ අයදුම්පත්‍රය ලබා ගත යුතු ය.

6. 1953 අංක 53 දරන සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සැළැස්මක් සඳහා වූ සෑම අයදුම් පත්‍රයක්ම එම ආඥාපනත යටතේ අනුමත කරන ලද ඉඩම් කොටස් සඳහාම විය යුතු ය.

7. ඉහත 6 වන වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයකටම අදාළ වූ සැළසුම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලද සංයුතියකින් යුත් කමිටුවක් විසින් පරීක්ෂා කර බැලිය යුතු ය.

8. 7 වන වගන්තියෙහි සඳහන් කාර්යය සඳහා සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියන් මගින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් හා ඉඩම් කොටසක් හෝ අනුබෙදුමක් සඳහා වන සැළසුම් පරීක්ෂා කිරීම, අදාළ සැළස්ම අනුමත කිරීම නිවාස හා නගර සංවර්ධන ආඥාපනත හා ඒ යටතේ සාදන ලද රෙගුලාසිවලට අනුකූලව විය යුතු ය.

10. අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සැළසුම් අයදුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම එය ප්‍රාදේශීය සභාව වෙත ලැබී දින 30 ක් ඇතුළත ඊට අදාළ අනුමැතිය හෝ එය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට අදාළ හේතු සහිත තීරණය අයදුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතු ය.

11. ඉහත 7 වන වගන්තියෙහි කමිටුවෙහි කාර්යය සඳහා ඊට අදාළ සංයුතියෙහි සාමාජිකයින් වෙනුවෙන් අතිරේක පාරිශ්‍රමිකයක් සභාව විසින් තීරණය කරන ලදුව අදාළ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ගෙවීම නීත්‍යානුකූල වන්නේ ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ ඉදිරිපත් වන අයදුම්පත්‍රය, ඉදිකිරීම් සඳහා අදාළ ඉඩම් කොටස් අනුමත කර ගැනීම සඳහා වන අයදුම්පත්‍රයක් වන විට දී අනුබෙදුමට අදාළ වන සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1ක් හෝ ඊට වඩා වැඩි වන විට දී, හා එම ඉඩම ඉඩම් කොටස් අටක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අනුබෙදුම් වන විට දී, අනුබෙදුමට අදාළ මාර්ග සඳහා වෙන්කර ඇති ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණයෙන් සියයට දහයක් වන ප්‍රමාණයන් අදාළ ඉඩමේ පොදු පහසුකම් වශයෙන් ප්‍රාදේශීය සභාව වෙත තෑගි කර හිමිකර දිය යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

''සභාව'' යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,
''සභාපති'' යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති ද,
''තැනැත්තා'' යන්නෙන් යම් පුද්ගලයකු හෝ සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද අදහස් වේ.

## සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiv) වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාවන් විධිමත් කිරීම, එකී සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල සේවාවන් යන්නට පහත සඳහන් දේ අදාළ වෙයි ;

(1) ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත් ය.

(i) සභාව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් සඳහා ඇතුළ්වීමේ ඉල්ලුම්පත්‍ර

(ii) සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර

(iii) වරිපනම් ලේඛනයෙහි උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර

(iv) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර

(v) වීථි රේඛා සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර

(vi) නොපවරවාගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර

(vii) ඊ ඤාන පියස පුහුණු පාඨමාලා ඉල්ලුම්පත්‍රය

(viii) සභාව සතු ගලිබවුසරයක්, ට්‍රැක්ටරයක්, මෝටර් ග්‍රේඩර්, බැකෝ ලෝඩර්, ජේසීබී යන්ත්‍රයක් සේවය සඳහා ලබා ගැනීමට අදල ඉල්ලුම්පත්‍ර.

(2) සහතික පත්‍ර නිකුත් කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත් ය.

(i) වීථි රේඛා සහතික
(ii) නොපවරා ගැනීමේ සහතික
(iii) වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික
(iv) වරිපනම් ලේඛනවල උධෘත සනාථ කරන සහතික
(v) නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික

(3) සභාව සතු ගලිබවුසරයක්, ට්‍රැක්ටරයක්, බැකෝලෝඩරයක්, මෝටර් ග්‍රේඩරයක්, ජේසීබී යන්ත්‍රයක් හා ජලබවුසරයක් කුළියට ලබාදීම.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත 4 වන වගන්තිය යටතේ විස්තර කර ඇති එක් එක් සේවාවන් සම්බන්ධයෙන් වන ගාස්තු කලින් කළ සභාව විසින් සභාව විසින් සභා සම්මුතියක් මගින් තීරණය කළ යුතු ය.

6. (i) ඉහත 4 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් යටතේම ඒ සමග ඉල්ලුම්පත්‍රය නිසියාකාරව සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් මාලාවක් ඇතුළත් විය යුතු ය.

(ii) එසේ නිකුත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 5 වන වගන්තිය යටතේ තීරණය කර ඇති පරිදි වන ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත ඉදිරිපත් කළ පසු ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් නිකුත් කළ යුතු ය.

7. (i) මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය යටතේ විස්තර කරන සේවා අපේක්ෂිත සෑම තැනැත්තෙක්ම, ඊට අදාල ඉල්ලුම්පත්‍රය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කරමින් සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියෙකු වෙත අදාල ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) නිසියාකාරව සම්පූර්ණ නොවූ හෝ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොවුන කිසිදු ඉල්ලුම්පත්‍රයක් භාර නොගත යුතු අතර, භාර ගනු ලබන ඉල්ලුම්පත්‍රයක් ඉහත 4 වන වගන්තියෙහි (2) වන උපවගන්තියට අදාල සේවාවන් වෙනුවෙන් වන විට දී, භාරගත් දිනෙන් දින තුනක් ඇතුළත ඊට අදාල සේවාව ඉටු කිරීම සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියකුගේ කාර්යය වන්නේ ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ විස්තර කරන සේවාවන් අපේක්ෂා කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ ලබාගත් ඉල්ලුම්පත්‍රයක් මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය යටතේ සේවා සඳහා ඉල්ලුම් කිරීමේදී ඉල්ලුම් කරනු ලබන අනුපිළිවෙලින් සේවය අපේක්ෂිත දිනයට අදාළව ඒ ඒ සේවා ගණයන් යටතේ ලේඛනගත කර ගැනීම සභාවේ සභාපති විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලැබූ අයෙකු විසින් සිදුකළ යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ විස්තර වන සේවාව සඳහා සභාව විසින් ඉහත 5 වන වගන්තිය යටතේ තීරණය කරන ලද ගාස්තුවලට අතිරේකව අයකළ යුතු තැන්පත් මුදලක් සභාව විසින් තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

11. ඉහත 8 වන වගන්තිය යටතේ ඉදිරිපත් වන සෑම ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම සේවය සැපයීම සඳහා වන හැකියාව සහ ප්‍රමුඛතා අනුපිළිවෙල යටතේ සේවය ලබාගැනීමට ඉල්ලුම්කරු එකගවන විටදී පමණක් ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තු හා ඊට අතිරේකව මෙහි 10 වන වගන්තිය යටතේ සභාව තීරණය කරනු ලැබ ඇති නිශ්චිත තැන්පත් මුදල ගෙවා ඇත්තේ නම්, පමණක් අදල සේවාව සැපයීම නීත්‍යානුකූල වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා " යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා සභාවේ සභාපති විසින් නිශ්චිතව රාජකාරී පැවරුමක් යටතේ කාර්යය කටයුතු ඉටු කරන අයකු ද ඇතුළත් වෙයි.

**ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii) ඌ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු සහා "බල ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන) ත්‍රිරෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ,

   (i) බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව සභාව යෝජනා සම්මුතියක් මගින් තීරණය කරන ලදුව එය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

   (ii) ඉහත (1) උපවගන්තිය අනුව තීරණය කළ ත්‍රී රෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සභා සම්මුතියක් මගින් සංශෝධනය කළ හැකි අතර, එවැනි සංශෝධනයක් *ගැසට් පත්‍රයක්* මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

   (iii) බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන නිශ්චය කිරීම එහි නතර කළ හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සහ එසේ ගන්නා ලද තීරණය සංශෝධනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත වන පරිදි වූ ප්‍රාදේශීය සභාවක රථ වාහන කමිටුවක නිර්දේශ පරිදි සභාව විසින් කළ යුතු ය.

   (iv) ඉහත (i) උපවගන්තිය අනුව තීරනය කරන ලද ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන අන්‍යයන්ට හඳුනාගැනීම පිණිස වන නාම පුවරුවක් සෑම නැවතුම් පොළක ඉදිරිපිට සවිකළ යුතු වන අතර, එම පුවරුවේ අදල නැවතුම් පොළේ සංකේත අංකය හා එම නැවතුම්පොළහි නවතා තැබිය හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව ප්‍රදර්ශනය කළ යුතු ය.

   (v) සෑම ත්‍රී රෝද නැවතුම් ස්ථානයකම ක්‍රමානුකූලව ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ආකාරය පළල අඟල් 4ක් වූ සුදු හෝ කහ පැහැති රේඛා මගින් සළකුණු කර තිබිය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව 4(i) වගන්තිය අනුව තීරණය කරන ලද බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයක, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස, කිසිදු තැනැත්තෙකු විසින් ත්‍රීරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් (මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අවලංගු කරනු නොලැබුවේ නම් නිකුත් කරනු ලැබ ඇති කාලසීමාව සඳහා) සභාව මගින් තීරණය කර ඇති පරිදි වූ නිශ්චිත කාලසීමාවකට වලංගු විය යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය, මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් විය යුතු ය.

9. අවසර පත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් අයකල යුතු ගාස්තු සභාව විසින් කලින් කල තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

10. ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයක ත්‍රී රෝද රථයක් නවතා තැබීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම, ඉල්ලුම්පතෙහි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඉදිරිපත් කර ඇත්තේ නම් මිස එය වලංගු ඉල්ලුම්පත්‍රයක් ලෙස සළකා ලේඛනගත නොකළ යුතුය.

11. ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයක ත්‍රිරෝද රථයක් නවතා තැබීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීමේදී ඉල්ලුම්කරු නැවතුම් ස්ථානයට වන ආසන්නතම පදිංචිය සැළකිල්ලට ගත යුතු අතර, ඉල්ලුම්කරු තමාට අයිතිවාසිකම් ඇති වෙනත් ත්‍රිරෝද රථයක් සඳහා ඒ වන විටත්, සභාවේ කවර හෝ ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථානයක් වෙනුවෙන් අවසරපත්‍රයක් ලබා ඇති අයෙකු නම්, වෙනත් කවර හෝ ඉල්ලුම්කරුවකු එම ත්‍රී රෝද රථ නැවතුම් ස්ථානය සඳහා ඉල්ලුම්කර නොමැත්තේ නම් මිස තවත් අවසර පත්‍රයක් සඳහා හිමිකම් නොලබන්නේ ය.

12. ත්‍රිරෝද නවතා තැබිය යුතු ස්ථානයක ත්‍රිරෝද රථයක් නවතා තැබීම සඳහා අවසරපත්‍රයක් සභාව විසින් නිකුත් කිරීමේදී, මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වන උපලේඛනයෙහි සඳහන් සංයුතියකින් යුත් ප්‍රාදේශීය සභාවේ රථවාහන කමිටුවක නිර්දේශය සැළකිල්ලට ගනිමින් සභාපති විසින් තීරණය කළ යුතු ය.

13. සභාව විසින් පවත්වාගෙන යන එම ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යාම සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකුගේ කාර්යය වන අතර, නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ විට දී එය ද අදාළ ලේඛනයෙහි සඳහන් කළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම,

*(අ)* වලංගු අවසර පත්‍රයෙහි පිටපතක් හෝ සභාව විසින් අවසර පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන යම් සළකුණක් සහිත ස්ටිකරයක් වේ නම් එය ත්‍රිරෝද රථයෙහි ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය.

*(ආ)* ත්‍රිරෝද රථයෙහි දකුණු පසින් මඟීන්ට නැගීමට හෝ බැසීමට නොහැකි පරිදි දෙරටුව වසා තැබිය යුතු ය.

*(ඇ)* ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයෙහි නවතා තබා ඇති ත්‍රිරෝද රථයක් එම ස්ථානයෙන් ඉවත් කර ගැනීම සඳහා කළ යුතු අළුත්වැඩියාවන් හැර වෙනත් කිසිදු අළුත්වැඩියාවක් එම ස්ථානයෙහි නොකළ යුතු ය.

*(ඈ)* ත්‍රිරෝද රථය නතර කර තැබීම සඳහා අවසර පත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් නැවතුම්පලකටද, එම අවසරපත්‍රය අදළ වන නැවතුම්පළෙහි හැර වෙනත් කවර හෝ නැවතුම්පළක හෝ වෙනත් පොදු ස්ථානයක කුළියට මඟීන් රැගෙන යාමේ අපේක්ෂාවෙන් ත්‍රිරෝද රථය නවතා තැබීම නොකළ යුතු ය.

(ඉ) සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටින විට දී අදළ වලංගු අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) ත්‍රී රෝද නවතා තැබිය යුතු ස්ථානයෙහි මත්පැන් පානය කිරීම, වෙනත් දුරාචාරයකට කටයුතු යෙදීම හෝ අන් අයට පීඩා වන පරිදි කටයුතු කිරීම හෝ එසේ කිරීමට වෙනත් අයට අනුබල දීම හෝ නොකළ යුතු ය.

15. කවර හෝ තැනැත්තෙකු විසින් සභාව මගින් පවත්වාගෙන යනු ලබන ත්‍රී රෝද රථ නැවතුම් ස්ථානයක හැර බල ප්‍රදේශයෙහි වෙනත් කවර හෝ පොදු ස්ථානයක හෝ වාහන ගමනාගමනයට බාධාවන පරිදි හෝ පදිකයින්ට බාධාවන පරිදි, කුළියට මඟීන් රැගෙන යාමේ අපේක්ෂාවෙන් ත්‍රී රෝද රථ නවතා තැබීම නොකළ යුතු ය.

16. ත්‍රී රෝද රථ නැවතුම් ස්ථානයෙහි හෝ ඊට ඇතුල්වන හෝ පිටවන ස්ථානයට බාධාවන පරිදි ත්‍රී රෝද රථයක් හෝ වෙනත් මෝටර් රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, වාර්ෂික අවසර පත්‍රයක් වන විට දී එය නිකුත් කරන ලද වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුයි.

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලද ත්‍රිරෝද රථයක් සඳහා අවසරලත් කාල සීමාව තුළ මසකට වඩා වැඩි කාලසීමාවක් එම ත්‍රිරෝද රථය හෝ ඒ වෙනුවට වන වෙනත් ත්‍රී රෝද රථත්, අදළ ත්‍රී රෝද රථ නැවතුම් ස්ථානයට යෙදවීමට නොහැකි වන අවසර පත්‍ර ලත් අයෙකුගේ අවසරය අවලංගු වූවාසේ සැළකිය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් අවසර පත්‍රයක්, එහි සඳහන් වලංගු කාල සීමාව අවසන් වීමට සති දෙකකට පෙරාතුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 2 වන උපලේඛනය යටතේම වන ඉල්ලුම්පත්‍රයක් මගින් සභාපති වෙතින් ඉල්ලුම් කිරීමෙන් හා මෙම අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් සුදුසුකම් ඒ සඳහා සපුරා ඇති විට අවසරලත් කාලය දීර්ඝ කර ගත හැකි ය.

20. (i) මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

(ii) 16(1) ව්‍යවස්ථාව අනුව නිසි අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක පනවනු ලබන දණ්ඩනයකට අමතරව සභාපති විසින් අවසරපත්‍රය අහෝසි කළ යුතු වේ.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"සභාපති " යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියෙකු " යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු ද,

"බල ප්‍රදේශය" යන්නෙන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය ද,

"ත්‍රීරෝද රථය" යන්නෙන් කුළී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රීරෝද රථයක් ද,

"කුළී රියදුරකු " යන්නෙන් ත්‍රීරෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අය ද,

"වාර්ෂික" යන්නෙන් වර්ෂයක ජනවාරි 01 වැනිදායින් ආරම්භ දෙසැම්බර් 31 වැනිදායින් අවසන්න වන ලිත් වර්ෂයක් ද,

"පොලිස් නිලධාරියෙකු " යන්නෙන් 53 වන අධිකාරිය වන 1865 අංක 16 පොලිස් ආඥාපනතේ 104 වගන්තිය මගින් දී ඇති අර්ථකථනයම ද,

"වෙනත් වාහන" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,

"ලියාපදිංචි හිමිකරු" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,
අදහස් වේ.

*පළමුවන උපලේඛනය*

සභාව විසින් පත් කරනු ලබන රථවාහන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

01. කමිටුවේ සභාපතිවරයා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විය යුතු ය. කමිටුවේ ලේකම් සභාවේ ලේකම් විය යුතු ය.

02. ප්‍රාදේශීය සභාවේ ආදායම්පරීක්ෂක සහ කාර්මික නිලධාරී

03. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු නම් කරනු ලබන නියෝජිතයකු

04. පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියොජිතයකු

05. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු

06. ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු

07. සභා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයන්හි පොලිස් ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයකු බැගින්

08. සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රීරෝද රථ සංගම්වල නියෝජිතයකු බැගින්

*දෙවන උපලේඛනය*

**ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරු පිළිබඳ විස්තර

(i) අයදුම්කරුගේ නම :
(ii) ස්ථිර පදිංචි ලිපිනය :
(iii) වරිපනම් අංකය :
(iv) ස්ථිර පදිංචියට අදාළ පළාත් පාලන ආයතනය :
(v) ජාතික හැඳුනුම්පත් අංකය :
(vi) දුරකථන අංකය :

02. වෙනත් තොරතුරු

(i) ත්‍රීරෝද රථ ලියාපදිංචි අංකය :
(ii) පදවන්නා අයිතිකරු ද ? නැතිනම් කුලී රියදුරුද යන වග :
අ) අයිතිකරු නම් වලංගු රියදුරු බලපත් අංකය :
ආ) කුලී රියදුරකු නම් :
ස්ථිර පදිංචි ලිපිනය :
ජාතික හැඳුනුම්පත් අංකය :
වලංගු රියදුරු බලපත් අංකය :

03. අවසරපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රීරෝද රථ නැවතුම්පළ
04. අවසරපත්‍රය ඉල්ලුම් කරන කාලය : මසකට/මාස 03කට/වසරකට

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත් මාගේ ත්‍රීරෝද රථ අවසරපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති ත්‍රීරෝද රථ නැවැත්වීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

..................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

..............................................................මහත්මා/මහත්මියට ..............................................අංක දරන ත්‍රීරෝද රථය ................................... දරන නැවතුම්පොළෙහි නැවැත්වීම සඳහා අවසරපත්‍රය .....................................................................දිනැති රථ වාහන කමිටුවෙහි නිර්දේශ පරිදි ............................ කාලයකට ලබා දීම අනුමත කරමි.

......................................
සභාපති,
................................ප්‍රාදේශීය සභාව.

දිනය :..............................

*මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiv) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන තනි සහ සමාජ කණ්ඩායම් සඳහා අවශ්‍ය අධ්‍යාපනික හා සමාජ තොරතුරු සැපයීම සහ පුද්ගල සංවර්ධනය මෙන්ම කියවීමේ රුචිය වැඩි දියුණු කරමින් නිර්මාණාත්මක සහ විනෝදාත්මක අවශ්‍යතා සපුරාලීමට විවිධ වූ මාධ්‍ය වලින් සමන්විත සම්පත් හා සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් මහජන පුස්තකාල සේවාවන් ආරම්භ කර පවත්වාගෙන යාම පිණිස ඊට අදාළ විධිවිධාන සැළැස්වීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. සභා බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා පරිදි මහජන පුස්තකාලය පහත සඳහන් අංශ හා සේවා කිහිපයකින් හෝ එහි සඳහන් සියල්ලෙන්ම හෝ සමන්විත විය හැකි ය.

1. බැහැරදෙන අංශය
2. විමර්ශන අංශය
3. ළමා අංශය
4. වාර සඟරා සහ පුවත්පත් අංශය
5. ශ්‍රව්‍ය දෘෂ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
6. අධ්‍යයන අංශය
7. ග්‍රන්ථ සංරක්ෂණ අංශය හා දුර්ලභ ග්‍රන්ථ අංශය
8. විශේෂිත එකතු හා ප්‍රාදේශීය එකතු අංශය
9. ආබාධිත ප්‍රජාව සඳහා පුස්තකාල සේවා අංශය
10. ප්‍රජා තොරතුරු සේවා අංශය
11. ඡායා පිටපත් හා වෙනත් තොරතුරු සේවා අංශය

5. ප්‍රාදේශීය සභාවේ සෑම මහජන පුස්තකාලයක් සඳහාම පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාලයේ සංවිධානය හා කළමණාකාරීත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වගකිව යුතු ය.

6. (1) මහජන පුස්තකාල සේවාවට උපදේශකත්වය හා මගපෙන්වීම සඳහා මෙහි මින්මතු කමිටුව නමින් හඳුන්වනු ලබන පුස්තකාල උපදේශක කමිටුවක් පත්කර ගත යුතුය. එම කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත වේ.

i. මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා.

ii. ප්‍රාදේශීය සභාව විසින් සභිකයන් අතුරින් සියලුම කණ්ඩායම් නියෝජනය වන පරිදි එක් කණ්ඩායමකින් එක් සභිකයෙකු ඇතුළත් වන පරිදි තුන් දෙනෙකුට නොඅඩු සාමාජික සංඛ්‍යාවක්.

iii. බල ප්‍රදේශයේ ජනතාව අදහන ආගම් නියෝජනය වන පරිදි එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින් පත්කරනු ලබන ආගමික නායකයන් උපරිම ලෙස තිදෙනෙකු.

iv. සභාව විසින් තෝරා පත්කර ගනු ලබන ප්‍රාදේශීය බලප්‍රදේශයේ ජීවත්වන විශිෂ්ඨ තැනැත්තන් පස්දෙනෙක්

v. තත්කාලයේ පුස්තකාලය භාරව සිටින නිලධාරියා කමිටුවේ ලේකම් විය යුතුය.

(2) කමිටුවේ සාමාජික සංඛ්‍යාව 15 ට නොවැඩි විය යුතු ය.

(3) සභාපතිවරයා නිල බලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, එහි සෑම රැස්වීමකම මූලාසනය ඔහු දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණි නොමැති විට සිටින සාමාජිකයින් අතුරින් තෝරා පත්කර ගනු ලබන තැනැත්තෙකු එම

රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

7. කමිටුව සඳහා

(1) ගණපූර්ණය සභාව විසින් පත්කර ඇති සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක් විය යුතු ය.

(2) කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේ ය.

(3) කමිටු රැස්වීමට නොදන්වා නොකඩවා වාර 03 කට නොපැමිණීම හේතුවෙන් ඔහුගේ පත්කළ සාමාජිකත්වය අහෝසි විය යුතු අතර, එසේ සාමාජිකත්වය අහෝසි වූ අයෙකු නැවත කිසිවිටෙක උපදේශක කමිටුවට පත් නොකළ යුතුය. එසේ සාමාජිකත්වය අහෝසි වූ සාමාජිකයින් වෙනුවෙන් සභාවේ තීරණය පරිදි නව සාමාජිකයින් තෝරා පත් කරගත යුතු ය.

8. (I) පුස්තකාලයේ බැහැරදෙන අංශයේ සාමාජිකත්වය ලැබීම සඳහා පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු ය.

(i) සාමාන්‍ය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වයස අවු. 14 ට වැඩි වීම, ළමා සාමාජිකත්වය සඳහා වයස අවු. 14ට අඩු හා අවුරුදු 03 ට වැඩි විය යුතු ය.

(ii) සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙක් හෝ අධ්‍යාපනය ලබන්නෙකු හෝ දේපළ හිමියෙකු හෝ රැකියාවක් කරන්නෙකු වීම.

(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ද අධ්‍යාපනය ලබන්නෙකු නම් විදුහල්පතිගේ සහතිකය ද රැකියාවක් කරන්නෙකු නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඉදිරිපත් කර සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකිය.

(2) පුස්තකාල බැහැර දෙන අංශයෙහි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමේදී පහත සඳහන් අයෙකු ඇපකරුවෙකු වශයෙන් සැළකිය හැකි ය.

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්,
(ii) පළාත් සභා මන්ත්‍රීවරයෙක්,
(iii) ප්‍රාදේශීය සභාවේ සභිකයෙක්,
(iv) පුස්තකාල කමිටුවේ සාමාජිකයෙක්,
(v) ආගමික පූජකවරයෙක්,
(vi) වෛද්‍යවරයෙක් හෝ නීතිඥයෙකු,
(vii) සාමදාන විනිශ්චයකාරයෙක්,
(viii) බල ප්‍රදේශයේ පාසලක විදුහල්පතිවරයෙක්,
(ix) සභාවේ සේවය කරන නිලධාරියෙක්,
(x) බල ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරියා.

(3) සාමාජිකත්වය ලබා ගැනීම

පුස්තකාල බැහැර දෙන අංශයෙහි සාමාජිකත්වය සඳහා අයකළ යුතු සාමාජික ගාස්තු කමිටුවේ නිර්දේශය පරිදි සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

9. මහජන පුස්තකාලයෙහි එක් එක් අංශ හා සේවා වෙනුවෙන් පහත සඳහන් පොදු කොන්දේසි අදළ විය යුතුය.

*i. බැහැරදෙන අංශය :*

i. මෙම අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියෙහි සඳහන් පරිදි සාමාජිකත්වය ලබා ගන්නා සෑම තැනැත්තෙකුටම පුස්තකාලයාධිපතිවරයා විසින් සාමාජික අංකයක් යටතේ කාඩ්පත් දෙකක් නිකුත් කළ යුතු අතර එක් තැනැත්තෙකුට එක් කාඩ්පතක් සඳහා එක් පොතක් බැගින් ලබාගැනීමට හිමිකමක් ඇත්තේය.

ii. මෙම කාඩ්පත්‍ර අන් සතු කිරීම නොකළ යුතුය.

iii. බැහැර ගෙනයනු ලබන සෑම පොතක් සම්බන්ධයෙන්ම වගකීමට සාමාජිකයා බැඳී සිටී.

iv. බැහැරදෙන කාඩ්පත් නැති වූ අවස්ථාවකදී ඒ පිළිබඳ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපති වෙත නොපමාව ලිඛිතව දැනුම්දිය යුතු ය. එම කාඩ්පතක් සඳහා බැහැරදෙන පුස්තකාලයෙන් පොතක් නිකුත් කර නොමැති විටක පුස්තකාලයාධිපතිවරයා සෑහීමට පත් වන්නේ නම් එහි අනු පිටපතක් තාවකාලිකව නිකුත් කළ හැකි ය.

v. කාඩ්පත නැතිවී නැවත ලබා ගැනීමේදී සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවක් කාඩ්පත නැවත ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු ය.

vi. එක් කාඩ්පතක් සඳහා බැහැර දෙනු ලබන පොතක් දින 14ක් වූ කාලයකට බැහැර ගෙන යාමට අවසර තිබේ. එම පොත වෙනත් සාමාජිකයෙකු විසින් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී දින 14 කට නොවැඩි කාලයක් සඳහා තවදුරටත් බැහැර ගෙන යාමට පුස්තකාලයාධිපතිට අවසර ලබා දිය හැකි ය.

vii. බැහැර ගෙන යාමට අවසර ලබාදී ඇති පොතක් ආපසු භාරදිය යුතු බවට සඳහන් දිනයට හෝ ඊට පෙර දිනයකදී ආපසු පුස්තකාලයට භාර දිය යුතු ය. නියමිත දිනයට වඩා ප්‍රමාද වී භාර දෙනු ලබන පොත් සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති පරිදි දඩ මුදලින් ගෙවීමට සාමාජිකයා බැඳී සිටී.

viii. බැහැරගෙන යාමට අවසර ලබා දී ඇති පොතක් දින 30 ක කාලයක් තුළ ආපසු පුස්තකාලයට බාර නොදුන් අවස්ථාවකදී එම පොත නැතිවූ සේ සළකා කටයුතු කළ යුතු ය.

ix. සාමාජිකයෙකු විසින් බැහැර ගෙන ගිය පොතක් නැතිවූ බව වාර්තා කළ අවස්ථාවකදී එම පොතේ පිටපතක් ලබාගෙන පුස්තකාලයට ලබා දිය යුතු ය. එම පොතේ පිටපතක් ලබා ගැනීමට නොහැකි අවස්ථාවකදී එම පොතේ වර්තමාන වටිනාකම හා 25% අතිරේක ගාස්තු අය කර ගත යුතු වේ. එම ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවකදී ඇපකරුගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ.

x. බැහැර ගෙන යන පොතකට හානි කිරීම, විකෘති කිරීම, කොල කැඩීම, ඉරි ඇඳීම, පාඨ ලිවීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් විරූප කිරීමක් නොකළ යුතු ය. එසේ හානි කර ඇති පොතක් ආපසු භාරදෙන අවස්ථාවේදී පුස්තකාලයාධිපති විසින් තක්සේරු කරන ලද අලාභය සාමාජිකයා විසින් ගෙවිය යුතු ය.

xi. බැහැර දෙන පුස්තකාලයෙන් පොතක් ලබා ගැනීමට පෙර එම පොත පරීක්ෂා කර බලා පොතට වී ඇති අලාභ හානි, විකෘති කිරීම් පිළිබඳව පුස්තකාලයාධිපති වෙත සාමාජිකයා විසින් වාර්තා කළ යුතු ය. එසේ වාර්තා නොකර බැහැර ගෙන යනු ලබන සෑම පොතක්ම අලාභ හානි හෝ විකෘති වීම් වලින් තොරව නිදහස් කළ පොතක් සේ සැලකිය යුතුය.

xii. බැහැර දෙන පුස්තකාලයට පොත ආපසු ලබා දෙන අවස්ථාවේදී යම් පොතක් තව දුරටත් නිකුත් කළ නොහැකි ප්‍රමාණයට අලාභ හානි වී ඇති බවට පුස්තකාලයාධිපති විසින් නිර්දේශ කරනු ලබන අවස්ථාවකදී නියම කරනු ලබන ගාස්තුව ගෙවන සාමාජිකයෙකුට එම පොත ''හානිවූ නිසා ඉවත් කරන ලදී'' යනුවෙන් මුද්‍රා තබා ලබා දිය හැකිය. ගාස්තු නියම කිරීමේදී ඉහත ix අනු වගන්තියේ සඳහන් පරිදි ගණනය කළ යුතුයි.

xiii. යම් සාමාජිකයෙකු විසින් පුස්තකාලයෙන් බැහැර ගෙන යනු ලබන පොතක් නිවසේ සාමාජිකයන් නොවන වෙනත් අයෙකුට පුස්තකාලයට භාර දිය හැකි අතර, සාමාජිකයන් නොවන කිසිවෙකුට පොත් බැහැර දෙනු නොලැබිය යුතුය. ආසාධක හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන සාමාජිකයෙකු පාවිච්චි කරනු ලැබූ පොතක් ආපසු පුස්තකාලයට භාර දෙනු ලබන අවස්ථාවේ දී එම පොත විනාශ කර එම පොතේ වර්තමාන වටිනාකම හා 25% ක අතිරේක ගාස්තුවක් පුස්තකාලයාධිපති විසින් අය කර ගනු ලැබිය යුතු ය.

xiv. බැහැර දීම සඳහා යම් පොතක් නිකුත් කළ යුත්තේ කවර සාමාජිකයාට ද යන්න පිළිබඳව මතභේදයක් ඇති වූ අවස්ථාවකදී පුස්තකාලයාධිපති විසින් එම මතභේදය විසඳිය යුතු ය.

xv. වෙනත් සාමාජිකයෙකු බැහැර ගෙන ගිය පොතක් යම් සාමාජිකයෙකු විසින් බැහැර ගෙන යාමට අපේක්ෂා කරන්නේ නම් ඒ කාර්යය සඳහා තබා ඇති ලේඛනයක සටහන් කළ යුතු ය. එම පොත ආපසු පුස්තකාලයට ලැබුණු විට ඉල්ලා සිටි සාමාජිකයා සඳහා වෙන් කළ යුතු ය. සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් ඉල්ලුම් කළ විට ලේඛනයේ සටහන් කළ අනුපිළිවෙලට පොත බැහැර ගෙන යාමට අවසර ලබා දීමට පුස්තකාලයාධිපති කටයුතු කළ යුතු ය.

xvi. සභාව තීරණය කරන ආකාරයට පුස්තකාලයේ බැහැර දෙන අංශය විවෘතව තැබිය හැකි ය.

*2. විමර්ශන පුස්තකාලය*

(i) වයස අවුරුදු 14 ට වඩා වැඩි කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ඕනෑම තැනැත්තෙකුට විමර්ශන පුස්තකාලය පරිහරණය කිරීමට සුදුසුකම් ඇත.

(ii) විමර්ශන පුස්තකාලය පරිහරනය කිරීමට අවශ්‍ය අයෙක් තම අනන්‍යතාවය තහවුරු කර පාඨක ලේඛනයේ නම, ලිපිනය, අත්සන තබා පුස්තකාලයාධිපතිගේ අවසරය ලබා ගත යුතු ය.

(iii) විමර්ශන පුස්තකාලයට හිස් කඩදාසි හැර වෙනත් කිසිදු ලිපි ද්‍රව්‍යයක් ගෙන ඒමට අවසර නොමැති අතර. පාඨකයෙකු විසින් විමර්ශන පුස්තකාලයට ගෙන යාමට අවශ්‍ය යැයි පුස්තකාලාධිපති විසින් අවසර දෙන ලේඛන පමණක් එහි ගෙන යා හැක.

(iv) විමර්ශනය සඳහා ලබා ගන්නා කිසිදු පොතක් කිසිම තැනැත්තෙකු විසින් විමර්ශන පුස්තකාලයෙන් බැහැරට ගෙන යාම නොකළ යුතු ය.

(v) විමර්ශනය සඳහා පැමිණෙන පාඨකයෙකු විමර්ශන පුස්තකාලයෙන් බැහැරව වෙනත් අංශයක ඇති පොතක්, ලේඛනයක්, වාර සඟරාවක් විමර්ශනය සඳහා අවශ්‍ය වන්නේ නම් විමර්ශන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිගේ අවසරය ලබාගෙන පරිහරණය කර නැවත තිබූ ස්ථානය මත තැබිය යුතුය.

(vi) මහජන පුස්තකාලය විවෘතව තබන වෙලාවන්හිදී විමර්ශන පුස්තකාලය ද විවෘතව තැබිය යුතුය.

(vii) අවසර ලබාදී ඇති ලිපිලේඛන වල පිටපත් සභාව විසින් තීරණය කරන ලද ගාස්තුවකට හා පුස්තකාලයාධිපතිගේ අවසරයට යටත්ව ලබා ගත හැකිය.

3. *ළමා පුස්තකාලය -*

(i) ළමා පුස්තකාලය සහා බල ප්‍රදේශය තුළ අවුරුදු 14ට අඩු අවුරුදු 3ට වැඩි ළමයින් සඳහා විය යුතු ය.

(ii) ළමා පුස්තකාලය විවෘතව තබන වේලාවන් පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශ අනුව ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි අතර, එම වේලාවන් පැහැදිලිව පෙනෙන ආකාරයට පුස්තකාලයේ ඉදිරිපස දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කළ යුතුය.

(iii) ළමා පුස්තකාලය තුළට (පරීක්ෂා කිරීමට බලය ලත් ) ප්‍රාදේශීය සභා පුස්තකාල කාර්යය මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයන් හැර වෙනත් වැඩිහිටි අයෙකුට ඇතුල්වීමට අවසරය ලබා නොදිය යුතු ය.

(4) *වාර සඟරා අංශය*

(i) වයස අවුරුදු 14 ට වැඩි කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ඕනෑම අයෙකුට වාරසඟරා අංශය පරිහරණය කිරීමට අවසර තිබිය යුතු ය.

(ii) එම අවසරය තම අනන්‍යතාවය තහවුරු කර පාඨක ලේඛනයේ නම, ලිපිනය හා අත්සන තබන අයෙකුට පුස්තකාලයාධිපති විසින් ලබාදිය යුතුය. වාර සඟරා අංශයේ ඇති වාර සඟරා, පොත්පත් හෝ වෙනත් ප්‍රලේඛන උපකරණ කිසිවක් රැගෙන යාම නොකළ යුතු ය.

(iii) බැහැරින් කිසිදු වාර සඟරාවක් පුවත් පතක් ලිපිගොනුවක් හෝ යම් උපකරණයක්, ගමන් මල්ලක්, වාර සඟරා අංශය ඇතුළට රැගෙන නොයා යුතු ය.

(iv) මහජන පුස්තකාලය විවෘතව ඇති කාලය තුළ වාර සඟරා අංශය විවෘතව තැබිය යුතු ය.

(5) *පුවත්පත් අංශය*

(i) පාඨකයන්ගේ පැමිණීමේ ලේඛනයේ නම, ලිපිනය අත්සන තබන හා තම අනන්‍යතාවය තහවුරු කරන ඕනෑම අයෙකු මෙම අංශයට ඇතුළත් වීමේ අවසරය ලබාදිය යුතු ය.

(ii) දිනපතා හා සතිපතා පුවත්පත් මෙම අංශය තුළ තිබිය යුතු අතර, පසුගිය මාසයක කාලය තුළ ප්‍රකාශයට පත් කළ පුවත්පත් පමණක් සංරක්ෂණය කළ යුතු ය.

(iii) මාස 01 ට වැඩි කාලයක් ගත වූ පුවත්පත් එම අංශයෙන් බැහැර කළ යුතු අතර, ප්‍රාදේශීය සභාවේ ගබඩාවට සුදුසු කටයුතු සඳහා භාරදෙනු ලැබිය යුතු ය.

(iv) පුවත්පත් අංශය විවෘතව තබන සතියේ දින හා වේලාවන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(6) *ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු සංනිවේදන තාක්ෂණික අංශය*

(i) තම අනන්‍යතාවය තහවුරු කරන පැමිණීමේ ලේඛනයේ නම, ලිපිනය, අත්සන තබන ප්‍රාදේශීය සභාව විසින් වරින්වර පනවනු ලැබිය හැකි ගාස්තුව ගෙවන ඕනෑම සාමාජිකයෙකුට පුස්තකාලයාධිපති විසින් මෙම අංශයට ඇතුල් වීමට අවසරය ලබාදිය යුතුය.

(ii) ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ හඬපට හා ශ්‍රවණ ආධාරක උපකරණ පරිශ්‍රයෙන් බැහැර ගෙන නොයා යුතු ය.

(iii) හඬපට නිකුත් කිරීමේ දී හා ආපසු භාර ගැනීමේ දී පාඨකයා හා පුස්තකාලයාධිපතිවරයා විසින් ශ්‍රවණ තත්ත්වය පිළිබඳ සහතිකතාවය ලබා දිය යුතු ය.

(iv) තොරතුරු සන්නිවේදන හා තාක්ෂණික අංශයේ පරිහරණය අපේක්ෂා කරන අය වෙනුවෙන් වෙනම ගාස්තු ප්‍රමාණය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නියම කරනු ලැබිය හැකි ය.

(v) පිටතින් රැගෙන එනු ලබන සංයුක්ත තැටි හෝ වෙනත් පරිඝණක මෘදුකාංග මෙම අංශයේ පරිඝණකවල යෙදීම නොකළ යුතු ය.

(vi) මෙම අංශය යටතේ පවත්වාගෙන යන ඉලෙක්ට්‍රොනික තැපැල අන්තර්ජාල පහසුකම් නියමිත ගාස්තු ගෙවා ඕනෑම අයෙකුට ලබා ගැනීමට හැකියාව ඇත්තේය.

(vii) මෙම අංශයේ භාවිතය සඳහා ඇති සංයුක්ත තැටි හෝ පරිඝනක මෘදුකාංග කිසිම ආකාරයකින් පිටපත් කිරීම හෝ බැහැර ගෙන යාම සඳහා අවසර නොදිය යුතු අතර, එහි පිටපතක් සභාව විසින් තීරණය කරන ගාස්තු ගෙවනු ලැබීමෙන් පසු ඉල්ලුම් කරන අයෙකුට නිකුත් කරනු ලැබිය යුතු ය.

(viii) සංයුක්ත තැටි මගින් පිටපත් ලබා ගැනීමට යම් පාඨකයෙකුට අවශ්‍යවන්නේ නම් ඒ සඳහා පුස්තකාලයාධිපතිගේ අවසරය ලබා ගත යුතු ය.

(7) *ශ්‍රවණාගාරය*

(i) අධ්‍යාපනික සංස්කෘතික සංවර්ධනය සඳහා වූ වේදිකා නාට්‍ය චිත්‍රපට, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, විවිධ ප්‍රසංග පැවැත්වීම ප්‍රසිද්ධ රැස්වීම් නොවන දේශපාලන වෘත්තීය සංගම් රැස්වීම් ආගමික දේශන පැවැත්වීම සඳහා ප්‍රාදේශීය සභාවේ ශ්‍රවනාගාරය සුදුසු අයදුම්කරුවන් සඳහා වෙන්කර දිය හැකි ය.

(ii) ඉල්ලුම්කරනු ලබන අනුපිළිවෙලින් ඒ සඳහා ලේඛනගත කළ යුතු අතර, සභාව විසින් තීරණය කර අයකරනු ලබන ගාස්තු හා තැන්පත් මුදල් ගෙවීමෙන් පසු ශ්‍රවනාගාරය වෙන් කිරීම ස්ථිර කළ යුතු ය.

(iii) ශ්‍රවනාගාරය වෙන් කරනු ලබන දිනය හැර වෙනත් දිනයක් සඳහා වෙන්කිරීමට අයදුම්කරුවෙකු ඉල්ලීමක් කරන්නේ නම් එම ඉල්ලීම කරන වෙනත් දිනය පෙර ගෙවන ලද ගාස්තු හා තැන්පතු මත වෙන් කර දීමට හැකිය. එම වෙනත් දිනය වෙනත් අයදුම්කරුවෙකුට වෙන් කර ඇති අවස්ථාවකදී මුල් දිනයේදී ශ්‍රවනාගාරය භාවිතා නොකිරීම මත ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර තැන්පත් මුදල් පමණක් ආපසු ගෙවීමට හැකි ය.

(iv) ශ්‍රවනාගාරය වෙන් කිරීමේ බලය සභාපතිවරයාට හෝ ඒ සඳහා බලය පැවරූ නිලධාරියා වෙත පැවරෙන අතර සාධාරණ හේතු මත වෙන් කිරීම අත්හිටුවිය හැකි ය.

(v) ශ්‍රවනාගාරය වෙන් කර ගනු ලැබූ සෑම අයදුම්කරුවෙක්ම,

*(අ)* ශ්‍රවනාගාරයේ හා අවට පරිශ්‍රයේ ඇති උපකරණ විදුලි උපාංග හා වෙනත් සියලුම සවිකිරීම්වලට අලාභහානි නොවන ආකාරයට කටයුතු කළ යුතු ය.

*(ආ)* අශෝභන නුසුදුසු අපිරිසිදු ඇඳුමෙන් හා නොගැලපෙන චර්යාවෙන් යුතු අය ශ්‍රවනාගාරය තුළට ඇතුල්වීම වැළැක්විය යුතු ය.

*(ඇ)* බීමත්ව සිටින අයෙක් ඇතුල් කිරීම හෝ ශ්‍රවනාගාරය තුළ මත්පැන්, මත් ද්‍රව්‍ය දුම්වැටි පාවිච්චි කිරීම වැළක්විය යුතු ය.

*(ඈ)* යම් ආසාධක හෝ ස්පර්ශ රෝගයකින් පෙලෙන හෝ ළඟදී පෙලුන අයෙක් හෝ එවැනි අයට සාත්තු කළ අයෙකු ශ්‍රවනාගාරයට ඇතුලත්වීමෙන් වැළැක්විය යුතු ය.

*(ඉ)* සදාචාරයට හිතකර නොවන දර්ශන පෝස්ටර් පිංතූර මූර්ති ප්‍රදර්ශනයට තැබීම වැළැක්විය යුතු ය.

*(ඊ)* ශ්‍රවනාගාරයට පැමිණෙන ප්‍රේක්ෂකයන්ගේ දේපළ බඩු බාහිරාදිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනිය යුතු ය.

*(උ)* සභාපතිතුමාගේ ලිඛිත අවසරය නොමැතිව මධ්‍යම රාත්‍රී 12.00 ට පසු ශ්‍රවනාගාරයේ රැඳී නොසිටිය යුතු ය.

8. *ශාඛා පුස්තකාල*

(i) ප්‍රාදේශීය සභාව තීරණය කරන ආකාරයට මහජන පුස්තකාලයට අනුබද්ධව ශාඛා පුස්තකාල පවත්වාගෙන යා හැකිය.

(ii) ශාඛා පුස්තකාලයේ අදාල සාමාජිකත්වය ප්‍රාදේශීය සභා සීමාව තුළ පදිංචිකරුවන්ට පමණක් සීමා විය යුතු ය.

(9) *කියවීම් ශාලා*

(i) ප්‍රධාන පුස්තකාලයට පරිබාහිරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කොට්ඨාස මට්ටමින් කියවීම් ශාලා පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(ii) කියවීම් ශාලා වෙතින් පුවත්පත් හා වාර සඟරා පමණක් පාඨකයන්ට කියවීම සඳහා ලබාගත හැකි ය.

(iii) තම අනන්‍යතාවය තහවුරු කිරීමෙන් හා නම, ලිපිනය, අත්සන පැමිණීමේ ලේඛනයේ ලියා තැබීමෙන් පසු කියවීම් ශාලා පරිහරණය කිරීමට අවසර ලබාදිය යුතු ය.

(10) ජංගම පුස්තකාල

(i) ප්‍රධාන පුස්තකාලයට හෝ ශාඛා පුස්තකාලවලට පැමිණීමට නොහැකි පුස්තකාල සාමාජිකයින් සඳහා මහජන පුස්තකාලයට සම්බන්ධිත ජංගම පුස්තකාල පවත්වාගෙන යා හැකි ය.

(ii) ජංගම පුස්තකාල සේවා පවත්වාගෙන යනු ලබන ස්ථාන හා එම සේවය පවත්වනු ලබන වේලාව, දිනය පුස්තකාල සාමාජිකයන්ට පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය.

(iii) ජංගම පුස්තකාල සේවය භාවිතා කරන්නන්ට විශේෂිත අවසර පත්‍රයක් නිකුත් කළ යුතු අතර, ප්‍රධාන පුස්තකාලයට හෝ ශාඛා පුස්තකාලයට එම විශේෂිත අවසර පත්‍රය වලංගු නොවිය යුතු ය.

*(11) අධ්‍යයන අංශය*

(i) ප්‍රධාන පුස්තකාලයට ශාඛා පුස්තකාලයන් ට අනුබද්ධ අධ්‍යයන අංශයක් පිහිටු වීම ප්‍රාදේශීය සභාවට තීරණය කළ හැකිය.

(ii) මෙම අධ්‍යයන අංශයට පැමිණීමේ ලේඛනයෙහි අනන්‍යතාවය සහිතව අත්සන් තබන ඕනෑම අයෙකුට ඇතුල්වීමට අවසර දිය හැකි ය.

(iii) පුස්තකාලයේ පොත්පත් වාර සඟරා පුවත් පත් අධ්‍යයන අංශයට ගෙනයාමට හෝ එහිදී පරිහරණය කිරීමට අවසර නොදිය යුතු අතර පාඨකයින්ගේ පෞද්ගලික ලිපි ලේඛන, පොත් පත් ලිපි ලේඛන වැනි දේ පමණක් පරිහරණයට අවසර දිය යුතුය.

(iv) පුස්තකාලය විවෘතව තබන කාලය තුළ අධ්‍යයන අංශය ද විවෘතව තැබිය යුතු ය.

(v) ස්වකීය අධ්‍යයන කටයුතු හැර වෙනත් කාර්යයන් එහි පැමිණෙන පාඨකයින් නොයෙදෙන බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමට පත් විය යුතු අතර, නිකරුනේ ගැවසෙන හෝ වෙනත් කාර්යයක යෙදෙන අයවලුන් එම ස්ථානයෙන් බැහැර කරවිය යුතු ය.

*(12) දුර්ලබ ග්‍රන්ථ හා ග්‍රන්ථ සංරක්ෂණ අංශය*

ඓතිහාසික වැදගත්කමක් ඇති හෝ මුද්‍රණයේ නොමැති හා මිළදී ගැනීමට නොහැකි ඕනෑම විෂයයක් සම්බන්ධයෙන් ලියවී ඇති ඕනෑම ග්‍රන්ථයක් සංරක්ෂණය කිරීම සඳහා මෙම අංශය පිහිටුවා ගත හැකි ය.

(i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හෝ කෞතුකාගාරයට භාරදීමට නීතියෙන් බැඳී නැති අවුරුදු 50 ට වඩා පැරණි දැනට මුද්‍රණයේ නොමැති හා මිළදී ගැනීමට නොමැති බවට හෝ පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නිර්දේශිත පොත් පත් වාර සඟරා පුවත් පත් මෙම අංශය තුළ සංරක්ෂණය කළ යුතු ය.

(ii) පුස්තකාලයාධිපතිවරයාගේ ලිඛිත අවසරය ලබා පර්යේෂකයන්ට මෙම අංශය භාවිත කළ හැකි ය.

*(13) ආබාධිත ජනතාව සඳහා පුස්තකාල සේවා අංශය*

(i) අන්ධ භාවය නිසා ආබාධිත වූ පාඨකයා සඳහා මෙම අංශය පිහිටුවිය යුතු අතර, බ්‍රේල් ක්‍රමයට සකස් කරනු ලැබූ පොත් පත් වාර සඟරා ලබා දීමට ඒ මගින් කටයුතු කළ යුතු ය.

(14) *ප්‍රජා තොරතුරු සේවා අංශය*

(i) ඓතිහාසික, සමාජ ආර්ථික, වානිජමය, අධ්‍යාපනික හෝ වෙනත් තොරතුරු අවශ්‍ය වන පාඨකයන් සඳහා සැපයීම ප්‍රජා තොරතුරු සේවා අංශය යටතේ සේවාවන් විය යුතු ය.

(ii) ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථා, සභා වාර්තා, ප්‍රගති වාර්තා, අයවැය ලේඛන, අවසාන ගිණුම් විග්‍රහය හෝ ප්‍රාදේශීය සභාවට අදාල තොරතුරු හා වෙනත් තොරතුරු අවශ්‍ය වන පාඨකයින් සඳහා සැපයීමට ප්‍රජා තොරතුරු අංශය පිහිටු විය යුතුය.

(iii) සභාපතිගේ හෝ පුස්තකාලයාධිපතිවරයාගේ ඒ සඳහා අවසර ලබාගන්නා ඕනෑම අයෙකුට ප්‍රජා තොරතුරු සේවා අංශය යටතේ තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතු ය.

(iv) මෙම අංශයට අදල යම් තොරතුරක් සම්බන්ධයෙන් පිටපතක් ඉල්ලා සිටින ඕනෑම අයෙකුට ඊට අදල නියමිත ගාස්තුව ගෙවා පිටපතක් ලබාගත හැකිය.

(15) ඡායා පිටපත් අංශය

(i) පුස්තකාලය පරිහරණය කරන පාඨකයින්ට යම් පොතක, වාර සඟරාවක පුවත්පතක කොටසක් ඡායා පිටපත් අවශ්‍ය වූ විට ලබාගැනීම සඳහා මෙම අංශය පිහිටු විය හැකි ය.

(ii) ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ගාස්තු ගෙවන පාඨකයෙකු පුස්තකාලයාධිපතිගේ අධීක්ෂණය යටතේ පිටපත් ලබා දිය හැකි ය.

(iii) කිසියම් අවස්ථාවකදී පොතක, පුවත් පතක වාර සඟරාවක කොටසක් පමණක් ඡායා පිටපත් ලබා දිය හැකි අතර සම්පූර්ණ පොතක් පුවත්පතක් වාර සඟරාවක් නැවත ඡායා පිටපත් කර ලබාදීම නොකළ යුතුය.

(16) මහජන පුස්තකාලයෙහි

(i) පුස්තකාලයට අයත් සියලුම අංශවලට පැමිණෙන පාඨකයින් හා නිලධාරීන්, සේවකයන් පුස්තකාලය විවෘතව පවතින කාලය තුළ පූර්ණ නිශ්ශබ්දතාවය රැකිය යුතු ය.

(ii) පුස්තකාලයට අයත් කිසිදු අංශයකට බීමතින් පැමිණීම පුස්තකාලය විවෘතව පවතින කාලය තුළ දී එම පරිශ්‍රය තුළ මත්පැන් බීම, දුම්බීම, බුලත් විට හැපීම, සූදු ක්‍රීඩාවක යෙදීම, එකිනෙකා අතර සාකච්ඡා කිරීම, නිකරුනේ ගැවසීම, පුස්තකාලයේ සාමාජිකයන්ට හා නිලධාරීන්ට බාධා වන ලෙස හැසිරීම, නිදා ගැනීම, ආහාර ගැනීම, සිඟමන් ඉල්ලීම, ආධාර එකතු කිරීම්, දේශන පැවැත්වීම, කිසියම් සතෙකු ගෙන ඒම, කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

(iii) පුස්තකාල පාඨකයෙකු බැහැරින් රැගෙන එන සියලුම භාණ්ඩ දොරටුව අසල පිළිගැනීමේ කවුන්ටරයට භාර දී ටෝකන් පත්‍රයක් ලබා ගත යුතුයි. එකී භාණ්ඩ එම දිනයේදීම පාඨකයා විසින් ඉවත් කර ගත යුතු අතර, එම දිනයෙන් පසුව එම භාණ්ඩ පිළිබඳව කිසිදු වගකීමක් නැත. ටෝකන් පත්‍රය අස්ථාන ගත වූ අවස්ථාවේදී භාණ්ඩවල අයිතිය සනාථ කළ පසු ආපසු භාරදීමට කටයුතු කළ හැකිය. නැතිවූ ටෝකන් පත්‍රය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව වැය කළ යුතු මුදල පාඨකයා ගෙවිය යුතුය. භාණ්ඩ භාරදීමට පෙර ආරක්ෂාව සඳහා ගනු ලබන පියවර ලෙස පරීක්ෂා කර බැලීමට නිලධාරීන්ට බලය හිමි වන අතර, භාණ්ඩ ආපසු නිකුත් කළ පසු සිදුවන අඩුපාඩු පිළිබඳව වගකියනු නොලැබේ. පරීක්ෂා කිරීමට විරුද්ධවන භාණ්ඩ කවුන්ටරයට භාර ගැනීම නොකළ යුතුය. වටිනාකමින් අධික භාණ්ඩ හෝ මුදල් කවුන්ටරයට භාර දීමෙන් වැලකීම සෑම පාඨකයෙකුම වගබලා ගත යුතු ය.

(iv) පුස්තකාලය වසා තබන කාලය තුළ එම පරිශ්‍රය තුළ රැඳී නොසිටිය යුතු අතර, සභාපතිවරයාගේ හෝ පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබා ඇති සේවකයකු හැර කිසිම අයෙකු පුස්තකාලයෙහි සේවාවන් අවසන් වීමෙන් පසු පුස්තකාලයේ රැඳී නොසිටිය යුතු ය.

(v) යම් ආසාදක හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන්නා වූ අයෙකු හෝ එවැනි රෝගියකු හෝ රෝගීන්ට සාත්තු කරන අයෙකු පුස්තකාල පරිශ්‍රයට ඇතුළ් නොවිය යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධි විධානයක් කඩ කරන, ලද උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තෙක්ම වරදකට වරද කරුවෙකු වන අතර, එසේ වරදකරු වී තිබියදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ නියමකර ඇති දඬුවමකට යටත් විය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස ;

''සභාව'' යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

''සභාපතිවරයා'' යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති ද,

''ලේකම්වරයා'' යන්නෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම් ද,

''පුස්තකාලයාධිපතිවරයා'' යන්නෙන් ප්‍රාදේශීය සභාවේ පුස්තකාල පරිපාලනය සඳහා එම තනතුරට පත් කරනු ලැබූ අයෙකු ද,

''ප්‍රධාන පුස්තකාලය'' යන්නෙන් ප්‍රාදේශීය සභා භූමිය තුළ පිහිටා ඇති මහජන පුස්තකාලය ද,

''කමිටුව'' යන්නෙන් පුස්තකාල උපදේශක කමිටුව ද අදහස් කරනු ලැබේ.

## සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(x) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම/ පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාවේ, සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, මංමාවතක, පොදු උද්‍යානයක, ක්‍රීඩාංගනයක හෝ වෙනත් යම් පොදු ස්ථානයක යම් කවර හෝ භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ආහාරයක් අතින් රැගෙන ගොස් හෝ බයිසිකලයක, ට්‍රයිසිකලයක, කරත්තයක හෝ වෙනත් යම් වාහනයක එහා මෙහා රැගෙන යමින් විකිණීම හෝ විකිණීම සඳහා තබා නොගත යුතු ය.

5. ඉහත 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම කලින් අවලංගු නොකරනතාක් නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවක් සඳහා ද එකී කාල සීමාව සඳහා පමණක් වලංගු වෙයි. බලපත්‍රයක් සඳහා වන උපරිම කාලසීමාව අදාල ලිත් වර්ෂය ඉක්ම නොයා යුතු ය.

6. සංචාරක වෙළඳාමට අදාළ බලපත්‍රයක් සමග වන සෑම ඉල්ලීමක්ම මෙම අතුරු ව්‍යවස්ථාවහි "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුකූල විය යුතු ය. එය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර අයකරනු ලබන ගාස්තු ගෙවා ලබාගත යුතු ය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ "ආ" උපලේඛනයට සාරානුකූල විය යුතු අතර, ඒ සඳහා අය කළ යුතු ගාස්තු බලපත්‍රයට අදාල කාල පරිච්ඡේදයන් සැළකිල්ලට ගනිමින් සභාව විසින් කලින් කළ තීරණය කළ හැකි ය.

8. සෑම සංචාරක වෙළෙන්දෙකුම වෙළෙඳ කටයුතුවල නිරත වන විට දී සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයෙහි ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතු හෝ ප්‍රදර්ශනය වන පරිදි තැබිය යුතු කොටස පැලද සිටිය යුතුය නැතහොත් ප්‍රදර්ශනය වන පරිදි තබා ගත යුතු ය.

9. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් තම බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස දන්වනු ලැබූ කවර අවස්ථාවකදී වුව ද සෑම සංචාරක වෙළෙන්දෙකු විසින් තම බලපත්‍රය සහ ඊට අදාළ ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

10. බලපත්‍රලාභී සෑම සංචාරක වෙළෙන්දෙක්ම වෙළඳාමේ ස්වාභාවය අනුව බල පත්‍රය යටතේ කාලය සීමා කර තිබේනම් හැර පෙ. ව. 06.00 සිට ප. ව. 10.00 දක්වා කාලය තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නිරතවීමට හිමිකම් ලබයි. එසේ වුව ද සභාපතිවරයා විසින් එකී කාලසීමාවෙන් බැහැරව වෙළඳාමේ නිරත වීම සඳහා අවසර දෙනු ලදුව, ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේනම් එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළඳාම් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

11. සංචාරක වෙළඳාම සඳහා සෑම අවසරපත්‍රලාභියකුම බෝවන රෝගයකින් පෙළෙන්නේ නම් වෙළඳ කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතු ය.

12. ආහාර විකිණීමේ ව්‍යාපාරයෙහි නිරතවී සිටින සෑම සංචාරක වෙළෙන්දෙක්ම පහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

   (අ) විකිණීමට රැගෙන යන ආහාරවලට මැස්සන් වැසීම වැළැක්වීමට සහ දූවිල්ල, අපද්‍රව්‍ය, දුර්ගන්ධය එකතුවීම වැළැක්වීමට හැකිවන සේ තබා ගත යුතු අතර, එම ආහාර පුද්ගලයන්ට ස්පර්ශ කිරීමද ඉඩ නොදිය යුතු ය.

   (ආ) ආහාර තබා ගන්නා වාහනය, පාපැදිය, කරත්ත, භාජන හා තැටි ආදිය සහ ආහාර සමග ස්පර්ශ වන සියලු උපකරණ හා උවාරණ නිතිපතා පිරිසිදුව තබාගත යුතු ය.

   (ඇ) ආහාර එතීම සඳහා පාවිච්චි කරනු ලබන කඩදාසි හෝ ද්‍රව්‍ය පිරිසිදුව හා ඒ සඳහා සුදුසු තත්ත්වයක පැවතිය යුතු ය.

(ඇ) ආහාර ස්පර්ශ කිරීම සඳහා පිරිසිදු උපකරණ හා මෙවලම් පාවිච්චි කළ යුතු ය. ආහාර විකිණීමේ කටයුතු සඳහා බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකු නොයෙදිය යුතු ය.

(ඉ) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට අන්තරායදායක වන සේ හෝ පීඩාවක් වන සේ ගින්දර පාවිච්චි නොකළ යුතු ය.

(ඊ) අපද්‍රව්‍ය හෝ අප ජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒවා සෞඛ්‍යාරක්ෂිත ආකාරයට ඉවත් කිරීම සඳහා සභාපතිවරයා සෑහීමකට පත්වන ආකාරයට කටයුතු සළසා තිබිය යුතු ය.

13. සෝ සාතක ආඥාපනත යටතේ සඳහන් කර ඇති සතෙකුගේ හෝ සතුන්ගේ මස් කිසිදු සංචාරක වෙළෙන්දෙකු විසින් විකිණීම නොකළ යුතු ය.

14. කිසියම් වසංගත රෝගයක් හෝ බෝවන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිරී ඇති ප්‍රදේශයක වශයෙන් හෝ විශේෂ අවස්ථානුගත කරුණක් හේතුකොටගෙන සභාපතිවරයා විසින් සංචාරක වෙළඳාම නොකළ යුතු ප්‍රදේශයක්, කලාපයක්, වීථියක්, මංමාවතක්, ව්‍යාපාරයක් ප්‍රකාශ කර ඇති විටක වලංගු බලපත්‍රයක් ඇත්තේ වූව ද එම ප්‍රදේශයක, කලාපයක, වීථියක, මංමාවතක සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

15. සංචාරක වෙළඳාම් කාර්යයන්හිදී ජනනය වන අපද්‍රව්‍ය ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇති කසල කලමනාකරණ ක්‍රමවේදයන්ට අනුකූලව මිස අන් කවර ආකාරයකට බාහිර පරිසරයට මුදා හැරීමක් නොකළ යුතු ය.

16. අතුරු ව්‍යවස්ථාව යටතේ බල පත්‍රයක් ලැබුවේ වුව ද පොදු වෙළඳපළ පරිශ්‍රයක් තුළ සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

17. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළඳාම කිරීම කිසිදු අවසරපත්‍රලාභියෙකු නොකළ යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධය අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව අදහස් වේ.
"සභාපති " යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය " යන්නෙන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.
"ආහාර" යන්නෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගනු ලබන ආහාර හා පාන වර්ග අදහස් කරනු ලැබේ.
"සංචාරක වෙළඳාම" යන්නෙන් තමා විසින්ම හෝ සතෙකුගේ ආධාරයෙන් හෝ වාහනයකින් හෝ කරත්තයකින් හෝ බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් ද්‍රව්‍ය රැගෙන යමින් කරනු ලබන වෙළඳාමක් අදහස් වේ.

*"අ" උපලේඛනය*

*සංචාරක වෙළෙඳාම සඳහා බල පත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :——— .
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :——— .
3. ඉල්ලුම්කරුගේ තාවකාලික ලිපිනය :——— .

4. ඉල්ලුම්කරුගේ ජා. හැ. අංකය :——— .
5. ඉල්ලුම්කරුගේ දු. අංකය :——— .
6. සංචාරක ව්‍යාපාරයේ ස්වාභාවය :——— .
7. සංචාරක ව්‍යාපාරය සිදු කරනු ලබන ආකාරය :——— .
8. ඉල්ලුම් කරනු ලබන බල ප්‍රදේශය :——— .
9. ඉල්ලුම්කරු පදිංචි බල ප්‍රදේශය :——— .
10. බලපත්‍රය අවශ්‍ය කරනු ලබන කාල සීමාව :——— .
11. සංචාරක වෙළඳාම සිදු කරනු ලබන වාහනයේ ලියාපදිංචි අංකය :——— .

දිනය :.................................

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

උපදෙස් ඃ

1. හැඳුනුම්පතේ පිටපතක් අමුණා තිබිය යුතුය ඃ
බලපත්‍රය ලබාදීම සඳහා ආදායම් පරීක්ෂකගේ නිර්දේශය

................................
ආදායම් පරීක්ෂකගේ අත්සන

බලපත්‍රය ලබාදීම සඳහා විෂය ලිපිකරුගේ වාර්තාව

............................
විෂය භාර කළමනාකරුගේ අත්සන.

දිනය ඃ................................
බලපත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

............................
ලේකම්.

දිනය ඃ................................

බලපත්‍රය ලබාදීම අනුමත කරමි/නොකරමි.

දිනය ඃ................................

............................
සභාපතිතුමා,
............................ ප්‍රාදේශීය සභාව.

*"ආ" උපලේඛනය*

සංචාරක වෙළඳාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම :——— .
2. බලපත්‍ර ලාභියාගේ ජා. හැ. අංකය :——— .
3. වෙළඳාමේ ස්වභාවය :——— .
4. අවසරය දෙනු ලබන ප්‍රදේශය :——— .
5. අවසරය දෙනු ලබන කාල සීමාව :——— .

දිනය ඃ.............................

.............................
සභාපති
......................ප්‍රාදේශීය සභාව

(මෙම කොටස ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතු ය නැතහොත් ප්‍රදර්ශනය කළ යුතු ය.)

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංචාරක වෙළඳාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි**

1. සම්පූර්ණ නම :——— .
2. ස්ථිර ලිපිනය :——— .
3. ජා. ඇ. අංකය :——— .
4. බල පත්‍රලාභියාගේ අත්සන :——— .
5. අවසරය දෙනු ලැබූ ප්‍රදේශය :——— .
6. අවසරය දෙනු ලැබූ කාල සීමාව :——— .
7. වෙළඳාමේ ස්වභාවය :——— .

දිනය ඃ.............................

.............................
සභාපති,
ප්‍රාදේශීය සභාව.

### ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(xiv) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. ප්‍රාදේශීය සභාවට අයත් සෑම ආදාහනාගාරයකම මෘත ශරීර ආදාහනය කිරීම, ඒ සඳහා ගාස්තු අය කිරීම සහ ආදාහනාගාර පාලනය විධිමත් කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු (මෙහි මින්මතු "බලයලත් නිලධාරී" ලෙස සඳහන් කරන) විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

5. 4 වන වගන්තියේහි සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යැයි සඳහන් කරනු ලබන) තැනැත්තෙකු විසින් "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :–

   (අ) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කරන, කළ හැකි වෙනත් ලියවිල්ලක්.

   (ආ) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(ඉ) ඡේදය යටතේ මෘතශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය හෝ අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කරන ලද සහතිකය ;

6. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛන ගත කළ යුතු වේ.

7. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාර ගනු ලබන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව අයකර ගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. අදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාර දිය යුතු වේලාව අවසර පත්‍රයෙහි සඳහන් කළ යුතු ය.

8. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා එයට හේතු වූ කරුණු සහිතව වහාම ඉල්ලුම්කරුවාහට දැන්විය යුතු ය.

9. සෑම දිනකම පෙ. ව. 08.00 සිට ප. ව. 08.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීමක් සඳහා මෘත ශරීර භාර ගනු ලැබිය හැක.

10. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ එයට ප්‍රථම ආසන්න විනාඩි තිහක කාලයක් තුළ මෘත ශරීර ආදාහනාගාර භාරකරුට භාර දිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුතාවය හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකීමට යටත් නොවිය යුතු ය.

11. සෑම ආදාහනාගාරයකම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, මියගිය අයගේ නම, ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු හා මියගිය තැනැත්තා අතර තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව හා අවසර පත්‍රයේ අංකය සහ දිනය ආදාහනාගාර භාරකරු විසින් ලේඛන ගත කරනු ලැබිය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනය කර පැය 72 ගත වීමට ප්‍රථම ඔහුගේ නියෝජිතයා භස්මාවශේෂ භාර ගත යුතු ය. එසේ වුව ද සභාපතිට හෝ බලයලත් නිලධාරියාට ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත භස්මාවශේෂ ආදාහනාගර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය. නියමිත කාලය ඇතුළත් භාරගනු නොලබන භස්මාවශේෂ බැහැර කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියකුට බලය තිබිය යුතු ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල් වීම වරදක් වන්නේ ය. එසේ වුවද, මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍රලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභහානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන්ගේ රාජකාරී කටයුතුවලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම වරදක් වන්නේ ය.

15. ආදහනාගාරය

(අ) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් නඩත්තු කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(ආ) නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ සහ ආදාහනාගාරයට අවසර පත් නිකුත් කරනු ලබන කාර්යලයක ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරවීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

16. මෘත ශරීරය ආදහනය කිරීම සඳහා අයකර ගත යුතු ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් කලින් කලට පනවනු ලැබිය හැකි අතර, එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාවට අවශ්‍ය යයි සළකනු ලැබූ අවස්ථාවලදී සංශෝධනය කළ හැකිය. එසේ පනවන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ගැසට් පත්‍රය මගින් නිවේදනය කළ යුතුය.

17. ආදාහනාගාරය ක්‍රියාත්මක වෙමින් පවතින් මොහොතක අනපේක්ෂිතව හට ගන්නා යාන්ත්‍රික දෝෂයක දී ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතු වන අතර එවැනි තත්ත්වයක් කවර ආකාරයකින් හෝ ඉල්ලුම්කරුට සභාවට හෝ සභාපතිවරයාට එරෙහි ක්‍රියාමාර්ගයක් සඳහා කරුණක් නොවිය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති දඬුවමකට යටත් විය යුතුය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදානාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු අදහස් වේ.
"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යකුගේ මෘත ශරීරිය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහි කරන ලද සිරුරක් ද ඇතුළත් වේ.

***"අ" උපලේඛනය***

*........................................අදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :———.

02. මියගිය තැනැත්තාගේ නම :——— .
පදිංචි වී සිටි ලිපිනය :——— .
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :——— .

06. මරණය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්
දිනය හා වේලාව :——— .

07. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :——— .

08. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දී තිබේද ? :——— .

09. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :——— .
(කැමැත්තේ අනුපිළිවෙල අනුව)

i. ....................................
ii. ....................................
iii. ....................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. අදාළ සහතික අමුණා ඇත.

................................................
අයදුම්කරුගේ අත්සන හා දිනය.

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි**

1. නියමිත ගාස්තු ගෙවා ඇති බවත් ඊට අදාළ ලදු පතේ අංකය ......................... හා දිනය ....................... වන බවත් ඉල්ලුම් කර ඇති ආකාරයට පැය ........................... පමණ ආදහනය සඳහා අවසර දීම අවසර දී ඒ සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමට නිර්දේශ කරමි.

................................
අත්සන,
විෂය භාර නිලධාරි.
දිනය :.................

2. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි.

................................
අත්සන,
සභාපති/බලයලත් නිලධාරි.
දිනය :..................

*බදු අයකර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබාගැනීමේ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(iii) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බදු අය කර ගැනීම සඳහා හා බදුවල කාර්යයන් සඳහා අවශ්‍ය වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීම සඳහා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාවේ බදු අය කිරීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති බද්දට යටත් සියළුම වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත පිළිගත් ගිණුම් ක්‍රමයකට අනුව වාර්ෂික ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතුය.

05. ලේකම් විසින් යම් වෙළඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් විෂයෙහි ඉල්ලුම් කරනු ලබන සියළුම මූල්‍ය හා ගිණුම්වලට අදළ තොරතුරු හා ලැබීම් පිළිබඳ වාර වාර්තා ලබාදීම ව්‍යාපාර බද්දකට හෝ කර්මාන්ත බද්දකට යටත් තැනැත්තෙකුගේ කාර්යය වන්නේය.

06. ලේකම්වරයා විසින් බද්දට අදළ කාර්යය සඳහා කලින් කල ඉල්ලා සිටිනු ලබන සියළුම මූල්‍ය හා ගිණුම් පිළිබඳ තොරතුරු හා ලැබීම් පිළිබඳ වාර වාර්තා පිළිගත් මූල්‍ය හා ගිණුම් ක්‍රම මත පිළියෙල කරනු ලබන ඒවා විය යුතුය.

07. ඉහත 05 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන සියලුම මූල්‍ය හා ගිණුම් තොරතුරු හා ලැබීම් පිළිබද වාර වාර්තා පිළිගත් ගිණුම් පරීක්ෂකයෙකු මගින් පරීක්ෂාවට ලක්කර සහතික කර තිබිය යුතුය.

08. ලේකම් විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා යවනු ලබන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින 14ක් ඇතුළත එකී දැන්වීම් මගින් ඉල්ලා ඇති තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

09. ඉහත 8 වගන්තිය යටතේ ඉල්ලා සිටින තොරතුරු සපයන කවර හෝ තැනැත්තෙකු තමන් ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බවට සෑහීමට පත්වී තිබිය යුතු අතර කවර අවස්ථාවක හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් නොකළ යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉල්ලා සිටිනු ලබන වාර වාර්තා හා අදාළ තොරතුරු පරීක්ෂා කිරීමට අවශ්‍ය වන විටකදී ලේකම් විසින් හෝ නිශ්චිතව කාර්ය පවරා ඇති නිලධාරියෙකු අදළ ව්‍යාපාරික පරිශ්‍රයට හෝ කර්මාන්ත පරිශ්‍රයට ඇතුල්වී ලේඛනවල සත්‍යතාවය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

11. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළහැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"ලේකම්" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන අය හෝ එම තනතුරෙහි වැඩ බලන අයද,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව අදහස්වේ.

"තැනැත්තෙකු" යන්නෙන් යම් පුද්ගලයෙකු, පුද්ගල මණ්ඩලයක්, සමාගමක් හෝ සංස්ථාව අදහස්වේ.

**පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) ඔ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරා දායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර විධිමත් කිරීම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන යටතේ දැක්වෙන පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

05. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

06. ව්‍යාපාරයේ පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිල්ලක් විය යුතු අතරම, එම ගොඩනැගිල්ල පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේය.

(අ) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනේල් සවිකර තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු වියයුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(ඇ) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(ඈ) වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) දැව කර්මාන්ත සියල්ල සායම් හෝ හුණු පිළියම් කර තිබිය යුතුය.

(ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් හෝ පිඟන් ගඩොල් සවිකර මනා තත්වයෙන් නිමවා තිබිය යුතුය.

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසල භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

07. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

08. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇතිවීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

09. සෑම බලපත්‍රධාරියෙකුම, යම් කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හෝ උසකින් වායුගෝලයට මුදාහැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුලින් පිටවීමට සැලැස්විය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර ඒවා දිනපතා සේදීම කළ යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබාගත යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසල, අතුගා එකතු කරනු ලබන බොල් රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ප්‍රාදේශීය සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

15. සෑම බලපත්‍රධාරියෙකුම හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙගවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

16. සෑම බලපත්‍රධාරියෙකුම යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් හෝ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයකින් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

17. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළදී පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළුවී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

18. බලපත්‍ර ලත් පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තව ද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියාකළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

19. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

20. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාරදිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතුය. නැතහොත් අලවා තිබිය යුතුය.

22. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥාපනතේ 122 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ,

"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය" යන්නෙන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

"ව්‍යාපාර" යන්නෙන් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමක් හෝ අලෙවිය සඳහා සූදනම් කිරීමක් හෝ එක් රැස් කිරීමක් හෝ වෙළඳාම අරමුණින් පවත්වාගෙන යාමක් අදහස්වේ.

*පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර*

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
2. සම් පදම් කිරීම
3. සම් විකිණීම
4. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම
9. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. සබන් නිෂ්පාදනය කිරීම
14. සත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
18. වේවැල් භාණ්ඩ නිපදවීම
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
20. සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම
21. රසකැවිලි වර්ග නිපදවීම
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
24. දත් බුරුසු නිපදවීම
25. රා එකතු කිරීම
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
29. සෝඩා නිපදවීම
30. සම් භාණ්ඩ නිපදවීම
31. පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
33. ඉටිපන්දම් නිපදවීම
34. කපුරු නිපදවීම
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
36. රෙදි සෝදන නිල් නිපදවීම
37. ලාකඩ නිපදවීම
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම
39. පාසැල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
41. ටයර් නැවත පිරවීම
42. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
47. පොහොර, හුණු,පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
49. ධාන්‍ය හෝ මාංශභෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම

*දෙවන උපලේඛනය - අන්තරායදායක ව්‍යාපාර*

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 50 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම
5. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
15. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම
18. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබාගැනීම
19. පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම
20. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම
21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
22. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම
23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
24. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම
25. දැව ගබඩා කිරීම

*තෙවන උපලේඛනය - පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර*

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ ගබඩා කිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
10. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
11. ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
15. කිලෝග්‍රෑම් 100 වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබාගැනීම
16. වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම
17. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම
18. පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම
20. වායුසමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම
21. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
22. කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

## මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix)(ඒ) යන වගන්තිය යටතේ බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, පාලනය හා බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම සඳහා ද පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. ප්‍රාදේශය සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාවට සාරානුකූලව සකස් කරන ලද ඉල්ලුම්පත්‍රයක් සභාව වෙතින් ලබා ගෙන ඒ සඳහා ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කළ යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කර වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු විකිණීමේ වෙළඳ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

*(අ)* සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල ඉදිකිරීමක් විය යුතුය.

*(ආ)* මාළු විකිණීම සඳහා ම භාවිතා කරනු ලබන කොටස කපරාරු කළ සිමෙන්ති හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

*(ඇ)* මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

*(ඈ)* අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

*(ඉ)* (ඈ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

*(ඊ)* අපජලය ගලා යාමට සලස්වන ලද උරාගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

*(උ)* මාළු වෙළඳ ස්ථානයෙන්, බැහැර කරන ලබන ජෛවභායන අපද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ තීරණය කර ක්‍රියාත්මක කරන ආකාරයට බැහැර ලීම් කළ යුතු ය.

*(ඌ)* ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

7. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

8. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයෙහි

(අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිට කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහ සහතිකවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු විසින්ම ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මාළු වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය

(i) ජෛවහායන අපද්‍රව්‍ය;
(ii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙළ කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළඳ ස්ථානයේ මාළු වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 6 වන වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

19. 18 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දිර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩිය යුතු ය.

20. 18 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වැරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හේ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,
"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය ද අදහස් වේ.

**ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xii)උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොළ විධිමත් කිරීම පිණිස පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පොළ සම්බන්ධයෙන් එක් එක් පොළට අයිති සීමාවන් (මෙහි මින්මතු පොළ භූමිය යනුවෙන් හඳුන්වනු ලබන) සභාව යෝජනා සම්මුතියෙන් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

05. ප්‍රාදේශීය සභාව විසින් තුළ පවත්වාගෙන යන පොල සතියේ පැවැත්වෙන දින සහ වේලාව සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

06. සභාව විසින් තීරණය කරන ලදුව පොළ පවත්වාගෙන යාම ඒ සඳහා ක්‍රියාත්මක ගිවිසුමක් යටතේ පාලනය වන අවස්ථාවකදී හැර සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස කිසිදු තැනැත්තකු පොළෙහි වෙළඳාම් නොකළ යුතුය.

07. ඉහත 6 වන වගන්තියෙහි සඳහන් අවසරපත්‍රයක් සඳහා ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියන් මගින් තීරණය කළ යුතුය.

08. පොළ භූමියෙහි ඒ ඒ භාණ්ඩ අලෙවිය සඳහා වෙන් කරන ලද සීමාවන් තුළ අදළ භාණ්ඩ අලෙවිය සිදු කල යුතු අතර, කිසිදු තැනැත්තෙකු පොල භූමිය තුළ සංචාරය කරමින් භාණ්ඩ වෙළඳාම නොකළ යුතුයි.

09. පහත සඳහන් කිසිදු ක්‍රියාවක් පොළ භූමිය තුළ නොකළ යුතුය.

*(අ)* මහජනයාට භාණ්ඩ මිළදී ගැනීමට ගමන් කිරීම සඳහා වෙන් කර ඇති මාර්ගයේ භාණ්ඩ අලෙවි කිරීම,ප්‍රදර්ශනය කිරීම හෝ යම් දෙයක් තබා මග අවහිර කිරීම.

*(ආ)* හිඟමන් යැදීම.

*(ඇ)* නොහික්මුණු ආකාරයට හැසිරීම හෝ අන් අයට යම් ආකාරයක කරදරයක් සිදු කිරීම.

*(ඈ)* පොළ භූමිය තුළ ඉහුම් පිහුම් සිදු කිරීම.

*(ඉ)* අවසර පත්‍රයේ සඳහන් පරිදි ලෙස වසනු ලැබීමෙන්පසුව පොල භූමියෙහි රැඳී සිටීම්.

*(ඊ)* ප්‍රාදේශීය සභාව විසින් අය කිරීමට අනුමැතිය ලබා දී ඇති ගාස්තු හැර බදුකරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් එයට වැඩි මුදල් එකතු කිරීම.

*(උ)* පොළ භූමිය තුළ තිබෙන පොදු දේපලට සහ ප්‍රාදේශීය සභාවේ දේපළට හෝ කොටසකට අලාභයක් කිරීම හෝ කවර ආකාරයක හෝ නුසුදුසු ක්‍රියාවක් කිරීම හෝ එවැනි ක්‍රියාවක් කිරීමට පෙළඹවීම.

*(ඌ)* පොළ භූමිය තුළ තිබෙන ජල කරාමවලින් රෙදි, වාහන සේදීම හා ස්නානය කිරීම.

(එ) පිළිකුල් සහගත හෝ ස්පර්ශක හෝ ආසාදන හෝ වසංගත රෝගයකින් පෙළෙන තැනැත්තෙකු පොළ භූමිය තුළ භාණ්ඩ අලෙවි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාණ්ඩ පොළට රැගෙන ඒම හෝ එවැනි රෝගියකුට ඇප උපස්ථාන කරමින් සිට පැමිණ පොළෙහි භාණ්ඩ විකිණීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාණ්ඩ රැගෙන ඒම සිදු කිරීම.

(ඒ) පිරිසිදු තත්ත්වයෙන් නොමැති භාණ්ඩ පොළෙහි අලෙවි කිරීම, අපිරිසිදු හා රෝග කාරක ස්ථානවලින් රැගෙන එන භාණ්ඩ අලෙවි කිරීම, විශ්වාසවන්තභාවයෙන් තොර භාණ්ඩ අලෙවි කිරීම.

(ඔ) නිවැරදි කිරුම් මිනුම් උපකරණ භාවිතා නොකිරීම.

(ඕ) සතුන් හා පක්ෂීන් හිංසාවට පත් කිරීම, සතුන් මරණයට පත් කිරීම.

(ක) පොළ භූමිය තුළ වාහන එහා මෙහා ගෙන යාම සහ නවතා තැබීම.

(ග) වස විෂ ද්‍රව්‍ය, ඉන්ධන, ප්‍රමිතියට හා මහජන අළෙවියට අවසර නොමැති පුපුරණ ද්‍රව්‍ය, නරක් වූ මස් හා මාළු අලෙවි කිරීම හා ප්‍රදර්ශනය කිරීම.

(ච) සත්ත්ව මාංශ කොටස්, ඉවත දමන සත්ත්ව කොටස්, කැළි කසළ හෝ අතුගා ඉවත දමන ද්‍රව්‍ය කිසිවක් කාණුවකට හෝ පොළහි තැනින් තැන දැමීම.

(ජ) පොළ රාත්‍රී 10.00 න් පසු පැවැත්වීම.

10. පොළ භූමිය තුළ වෙළඳාම් කිරීමේදී එක් රැස්වන කසළ බැහැර කරලීම පහසු වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයකට හැර තැනින් තැන කසළ දැමීම, වෙනත් ආකාරයකින් පොළ භූමිය අපවිත්‍ර කිරීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

11. පොළ භූමියෙහි මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු සිදු වන්නේ ද යන්න සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු ඕනෑම අවස්ථාවකදී පරීක්ෂා කිරීම නිත්‍යානුකූල අතර, එසේ ක්‍රියා කරන ලද අවස්ථාවක ඊට බාධා කිරීම හෝ එය වළක්වන පරිදි ක්‍රියා කිරීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

12. පොළ පැවැත්වෙන දින නියමිත වේලාවට පැය 12කට පූර්වාසන්න කාල සීමාවකදී හැර වෙළඳාම සඳහා කිසිදු තැනැත්තෙකු පොළ භූමියට ඇතුල්වීම නොකළ යුතුය.

13. පොළ භූමියෙහි ඉදිකර ඇති හෝ සවිකර ඇති කිසිදු දේපළකට හානි වන කිසිදු ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

14. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොඩකවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දන්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, අදහස් වන්නේය.

**සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii)ඒ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියා නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි හා ප්‍රසිද්ධ ස්ථානයන්හි සැරසිලි කිරීම නොකළ යුතුය.

5. කවර හෝ සැරසිල්ලක් සඳහාම අවසර පත්‍රයක් ලබා ගැනීමේදී මෙම අතුරු ව්‍යවස්ථාවේ I වන උපලේඛනය අනුව අයදුම්පතක් සැරසිලි කිරීමට යටත් පිරිසෙන් පැය 48 කට පෙර සභාපති හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු සැරසිලි සිදු කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අවසර පත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කරනු ඇත.

7. අවසර පත්‍රයක් යටතේ වුවද කවර හෝ සැරසිලි සඳහා කවර හෝ අවස්ථාවක පොලිතීන් භාවිතා නොකළ යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන සෑම අවසර පත්‍රයක් සඳහාම අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කරන ගාස්තු විය යුතු ය.

   *(අ)* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සෑම සැරසිලි කාර්යයක් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා සභාව විසින් තීරණය කරන ඇති පරිදි තැන්පතු මුදලක් සභාවේ තැන්පත් කළ යුතු ය.

   *(ආ)* අවසර පත්‍රයක් ලත් යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් සැරසිල්ලක් අවසර පත්‍රයේ සඳහා සැරසිලි ඉවත් කළ යුතු යැයි සඳහන් දිනයෙන් පැය 24ක් තුළ සැරසිලි ඉවත් නොකරන ලද්දේ නම්, සභාව විසින් එම සැරසිලි ඉවත් කර, ඊට වැය වූ වියදම් සභාවේ ඒ සඳහා තැන්පත් මුදලින් අයකර, යම් ඉතිරි මුදලක් වේනම්, එය තැන්පත්කරු වෙත ආපසු ගෙවීම නීත්‍යානුකූල වන්නේ ය.

9. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කරනු ලබන සැරසිල්ලක්, ප්‍රදේශයේ මාර්ග සංඥා පුවරු, ප්‍රදේශ සිතියම් හා නාමපුවරු, දුරකථන හා විදුලි රැහැන් කණු, පාලම් වැසී යන සේ හෝ අවහිර වන සේ නොකළ යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

''සභාව'' යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සැරසිල්ලක් " යන්නෙන් යම් සිද්ධියක් හෝ යම් කාර්යයක් අරමුණු කරගත්, කෘත්‍රිම හෝ ස්වාභාවික ද්‍රව්‍යවලින් යුතුව, එම සිද්ධිය හෝ කාර්යය නියෝජනය කිරීම සඳහා තාවකාලිකව කරනු ලබන සකස් කිරීම් හා නිර්මිත ද අදහස් වේ.

### *I වන උපලේඛනය*

*අයදුම්පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :-
2. දුරකථන අංකය :-
3. ජාතික හැඳුනුම්පත් අංකය (ඡායාපිටපතක් අමුණා තිබිය යුතුය.) :-
4. සැරසිලි කරන වීථියේ හෝ ප්‍රසිද්ධ ස්ථානයේ නම :-
5. සැරසිල්ලේ ස්වභාවය :-
6. සැරසිලි ප්‍රදර්ශනය කරන කාල සීමාව :-
7. සැරසිල්ල කුමක් අරභයාද යන වග :-
8. සැරසිලි ඉවත් කර ගන්නා දිනය :-
9. ඉවතලන දෑ බැහැර කරන ආකාරය :-

ප්‍රාදේශීය සභාවේ පිළිගත් නියමයන්ට එකඟව සැරසිළි ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

තාක්ෂණ නිලධාරි නිර්දේශය :-

දිනය : - අත්සන.

ලේකම්ගේ නිර්දේශය :-

දිනය : - අත්සන.

අවසර පත්‍රය නිකුත් කිරීම, ලේකම් විසින් නිර්දේශිත රු. ................... වටිනාකම් ඇති තැන්පත් මුදලක් අයකර අනුමත කරමි/අනුමත නොකරමි.

දිනය : - සභාපති.

**පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) ඈ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම හා පාලනය කිරීම හා කළමනාකරණය සඳහා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව පොදු වැසිකිළි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

04. පොදු වැසිකිළියක් භාවිතා කිරීමේදී නිශ්චිතව ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයට හැර වෙනත් කිසිම ස්ථානයකට මළපහ කිරීම හෝ මුත්‍රා කිරීම නොකළ යුතුය.

05. වැසිකිළියට සපයා ඇති ජලය වැසිකිළියේ කටයුතු සඳහා හැර වෙනත් කිසිම කටයුත්තක් සඳහා කිසිම පුද්ගලයෙකු විසින් භාවිතා නොකළ යුතු ය.

06. කිසිම තැනැත්තෙකු විසින් පොදු වැසිකිළියක හෝ ඊට සම්බන්ධ වැසිකිළි තැටි තුළට හෝ කාණු තුළට හෝ වෙනත් විවර ස්ථාන තුළට ගඩොල්, පස්, ගල්, අළු හෝ එම කාණු අවහිර වන වෙනත් කිසිම ද්‍රව්‍යයක් දැමීම හෝ තැබීම නොකළ යුතු ය.

07. පොදු වැසිකිළියක අළුත්වැඩියාවකදී හැර වැසිකිළි තැටියක, නලයක, කපාටයක, ටැංකියක හෝ වෙනත් සවි කිරීමක් සවි කර ඇති ආකාරය, පිහිටීම හෝ පිළිවෙළ හෝ කිසිම තැනැත්තෙකු විසින් හානියට පත් කිරීම, ඉවත් කිරීම, අවහිර කිරීම හෝ කිසිදු ආකාරයකින් වෙනස් කිරීම හෝ එම වැසිකිළියේ යම් බිත්තියක් බිමක් වහලයක් හෝ ව්‍යුහයන් යන මේ කොටසක් ඕනෑකමින් විනාශ කිරීම, විරූප කිරීම, හානියට පත් කිරීම හෝ පළුදු කිරීම කරනු නොලැබිය යුතු ය.

08. ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝජන සඳහා වෙන් කර තිබෙන්නා වූ යම් පොදු වැසිකිළියකට කාන්තාවන් පමණක්ද, පුරුෂයන් සඳහා වෙන් කර ඇති වැසිකිළි සඳහා පිරිමින් පමණක්ද, ආබාධිතයන් සඳහා වෙන් කර ඇති වැසිකිළියක් සඳහා ආබාධිතයන් පමණක් ද ඇතුළත් විය යුතු අතර, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු කරන අවස්ථාවලදී දෙරවල් වසා ඒ බව ඊට ඇතුලත්වන ස්ථානයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රදර්ශනය සඳහා සකස් කර ඇති දැන්වීම ප්‍රදර්ශනය කරමින් වැසිකිළිය අළුත්වැඩියා කිරීම හෝ ශුද්ධ පවිත්‍ර කිරීම කළ යුතුය.

09. පොදු වැසිකිළියක උපස්ථායකයෙකු, මුරකරුවෙකු, සේවකයෙකු හෝ භාරකරුවෙකු විසින් තම රාජකාරී ඉටු කරන අතරතුර දී කරනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පැහැර හැරීම, ඊට බාධා කිරීම නොකළ යුතු ය.

10. පොදු වැසිකිළිය මළපහ කිරීමට, මුත්‍රා කිරීම සඳහා පමණක් භාවිතා කළ යුතු අතර, එහිදී දුම්පානය, මත්ද්‍රව්‍ය භාවිතය වැනි දේ නොකළ යුතු අතර, නිකරුණේ රැඳී සිටීම නොකළ යුතු ය.

11. පොදු වැසිකිළියක නඩත්තු හා භාරකාරිත්වය පෞද්ගලික අංශයකට පවරා ඇති අවස්ථාවකදී එකී පැවරුම්ලාභියා මගින් දිනපතා වැසිකිළිය සෝද පවිත්‍ර කර තබා ගත යුතුය. වැසිකිළිය නඩත්තු කටයුතු සඳහා ගාස්තුවක් අය කරන්නේ නම් අදල මුදල දැන්වීමක් මගින් ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

12. වැසිකිළිය පිරිසිදුව හා සනීපාරක්ෂිතව නිරන්තරයෙන්ම තබා ගත යුතු වන අතර, දිනපතා විෂබීජ නාශක යොද පිරිසිදු කර, මනා තත්ත්වයකින් යුතුව පවත්වාගෙන යා යුතු ය.

13. පොදු වැසිකිළිය පුද්ගලයෙකුට හෝ වෙනත් ආයතනයකට පවරා ඇති විටදී වියදම් සඳහා ඔහු විසින් අය කළ යුතු මුදල් ප්‍රමාණය වරින් වර සභාව විසින් තීරණය කළ හැකිය. එම ගාස්තුව පමණක් එකී පුද්ගලයා විසින් වැසිකිළිය භාවිතා කරන්නාගෙන් අය කළ යුතු ය.

14. මේ අතුරු ව්‍යවස්ථා කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වැදරකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

**ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(xxx) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, එසේ ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. කිසිම තැනැත්තෙකු විසින්, යම් මංමාවතකට පෙනෙන කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙහි සභාපති විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරනු නොලැබිය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ප්‍රචාරක දැන්වීම යන්නෙන් ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, ප්‍රාදේශීය සභා හෝ පෞද්ගලික මාර්ගයට පෙනෙන සේ පුවරු, බැනර්, කටවුට්, අලුමිනියම් තහඩු, යකඩ, පොලිතීන්, රෙදි හෝ කොළවල ඇඳීමෙන් ද නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක් ද, නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක අකුරු හෝ රූප යෙදා යම් වෙළඳ ස්ථානයක්, වෙළඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ද, වෙළඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන්හිදී යොදන විශේෂ දැන්වීම් විද්‍යුත් නාම පුවරුද අදහස් වන්නේ ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ :

   *(අ)* කවර හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි පළමුවන උපලේඛනයෙහි සඳහන් ආකෘතියට අනුකූල වියයුතු අතර අනුකූලව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සභාවෙහි සභාපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

   *(ආ)* ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ඉල්ලුම්පත්‍රයක් සඳහා අයකරනු ලබන ගාස්තුව සභාව කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

7. ඉහත 6 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් සමඟ පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

   *(අ)* දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම.

   *(ආ)* 1 : 1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහන

   *(ඇ)* එම සැලැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතරයෙහි, මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලවනු පිණිස කරන සංශෝධන වෙතොත් එම සංශෝධන.

   *(ඈ)* ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවක අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්.

   *(ඉ)* යාබද වීථිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැලැස්ම.

8. ප්‍රාදේශීය සභාවෙහි සභාපති විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන්වලට සහ පිරිවිතරයන්ට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ 6 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලුම් පත්‍රයක්ම ප්‍රාදේශීය සභාවෙහි සභාපති විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක මෙහි පහත (2) උපලේඛනයෙහි සඳහන් ආකාරයට තීරණය කර නියමිත ගාස්තු ගෙවන තෙක් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

10. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම එම බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

11. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට ඒ දැන්වීම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වන්නේ නම් මිස අදාළ නොවිය යුතු ය.

(අ) ලබන ශුද්ධ ආදායම් ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක්
(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වන ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්
(ඇ) ආගමික, දේශපාලන මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්
(ඈ) "කුලියට දීමට තිබේ " යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්
(ඉ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්
(ඊ) ගෘහ නාම පුවරු
(උ) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.93ක් නොඉක්මවන නාම පුවරුවක්
(ඌ) වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක් එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වාභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම සහ ලිපිනය දුරකථන අංකය විද්‍යුත් තැපැල් ලිපිනය ආදිය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්
(එ) බලප්‍රදේශය තුළ යම් මාර්ගයක්, පොදු ස්ථානයක්, වටරවුමක්, මෝටර් වාහන සංඥා හැඳින්වීම සඳහා අනුග්‍රාහක දයකත්වයන් යටතේ සකස් කරන ලද දැන්වීමක්.
(ඒ) යම් ව්‍යාපාරික ස්ථානයක් එම ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය හා එම ව්‍යාපාරය කරන්නාගේ නම පමණක් සඳහන් වී වන පරිදි පිළියෙල කර ඇති දැන්වීමක්.

එසේ වුවද කිසියම් ව්‍යාපාරික ස්ථානයක එම ව්‍යාපාරයේ නම, ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය හා එම ව්‍යාපාරයේ කරන්නාගේ නම සඳහන් වී ඊට අතිරේක වන පරිදි අනුග්‍රාහකයෙකුගේ හෝ වෙනත් යම් භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක හෝ සේවාවක නමක්, ලකුණක් හෝ වෙනත් සඳහනක් ප්‍රචාරනය සඳහා කරුණු යෙදී ඇත්තේ නම් අදල ප්‍රචාරක දැන්වීමේ පුවරුවේ ඊට සාපේක්ෂ කොටස සඳහා මෙම අතුරු ව්‍යස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන විධිවිධාන අදළ විය යුතුය.

2. කිසිම තැනැත්තෙකු විසින්;

(අ) යම් වීථියක, පාරක හෝ අඩි පාරක රිය මඟට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම.
(ආ) පොළොවේ සිට මීටර් 15ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ
(ඇ) කිසියම් වීථියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවි කොට නැතහොත් එල්ලා තැබීම.
(ඈ) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් අකාරයකට තැනීම, ඉදිකිරීම නොකළ යුතු ය.

12. කිසිම තැනැත්තෙකු විසින්, පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාළමක හෝ පාරේ ඇති මාර්ග පාළමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතු ය.

13. සභාවේ යෝජනා සම්මතයක නිශ්වය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති දැන්වීම් පුවරුවක් වන්නේ නම් මිස, ප්‍රදර්ශනය නොකළ යුතු ය.

14. කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් වීථියක හෝ පාරක යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හැඳින්වීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමර් ෆෝනයක්, සංගීත භාණ්ඩයක්, සීණුවක් හෝ වෙනත් උපකරණයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අවසරයකින් තොරව පාවිච්චි කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

15. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ,

(අ) යම් ප්‍රචාරක දැන්වීමක්, අවලස්සන හෝ පිළිකුල් සහගත හා මහජන සදාචාරයට හානිකරන යමක් නිරූපණය කරන අවස්ථාවක ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස ඒ ප්‍රචාරක දැන්වීම සිදු කරන තැනැත්තාට නියම කළ හැකිය.

(ආ) මෙම වගන්තියෙහි (අ) උපවගන්තිය යටතේ නිවේදනයක් භාර දෙනු ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එහි නිශ්චිත කොට දැක්වෙන කාලය ඇතුළත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතු ය.

16. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්,

(අ) ඒ පුවරු නිසි අළුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු ය.

(ආ) ඒ පුවරු ඉදිරිපස, ප්‍රකටව පෙනෙන තැනක පැහැදිලි හා කියවිය හැකි අකුරෙන් ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතු ය.

17. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍රය සඳහා ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක ප්‍රාදේශීය සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම නොකළ යුතු ය.

18. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදකට වරදකරු වීමෙන් පසු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව සභාව විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

20. එලෙස යම් තැනැත්තෙකු හෝ ආයතනයක් දිගින් දිගටම බලපත්‍රයක් ලබා නොගෙන ප්‍රචාරක දැන්වීම් පළ කිරීම හේතු කොට ගෙන හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් කොන්දේසි කඩ කිරීම හේතුකොටගෙන වරදකට වැරදිකරුවකු වී ඇති අවස්ථාවක දී එකී තැනැත්තා හෝ ආයතනය එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක කාර්යයන් සඳහා අසාධු ලේඛනගත කිරීම පිළිබඳ ප්‍රාදේශීය සභාව තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

21. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට ඉතිරිව තිබියදී වුව ද, යම් අයුරකින් සවිකරන ලද, බිත්තියට හෝ තාප්පයක අඳින ලද බැනරයක්, කටවුට් එකක් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් කෙසේ හෝ සුළඟට ඇලවී, ගැලවී, බිම ඇද වැටී හෝ දුර්වර්ණ වී කැඩී බිඳී, වෙනස් වී නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ බාධා වේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාල අයිතිකරු වෙත භාර දීමෙන් පසු දින 7ක් ඇතුළත යථා පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැති නම් සභාව විසින් එය ඉවත් කිරීම කල යුත්තේ ය. සභාව විසින් එසේ දැන්වීමෙන් දින 14ක් ගතවීමෙන් පසු සභාවේ සේවකයන් යොදවා දැන්වීම ඉවත් කිරීමට සිදුවුවහොත් එකී දැන්වීම පිළිබඳ කිසිම වගකීමක් සභාව විසින් නොදැරිය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,
"සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, අදහස්වේ.

*01 උපලේඛනය*

*ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
02. ස්ථිර ලිපිනය :——— .
03. අයදුම්කරුගේ දුරකථන අංකය :——— . විද්‍යුත් තැපැල් ලිපිනය :——— .

04. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන වෙළඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය :——— .
05. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන :——— .
06. අදාළ ආකෘතිය අමුණා තිබේද ? :——— .
07. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර)
08. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම් දුර්වර්ණ වීම, ඇලවීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද ? යන්න

ප්‍රාදේශීය සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

...................................
(අයදුම්කරුගේ අත්සන).

දිනය :——— .

පහත සඳහන් ලිපි ලේඛන අමුණා ඇත.

i. ප්‍රචාරක දැන්වීම අයදුම්කරුට අයිතිවාසිකම් නොමැති දේපලක ප්‍රචාරණය කරන්නේ නම් එම දේපලට අයිතිවාසිකම් ඇති අයගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය.
ii. අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තිය යටතේ අවශ්‍යතා සනාථ කරන ලේඛන.
iii. එකී දැන්වීම නිවසක, කඩයක, හෝටලයක.

*02 උපලේඛනය*

| *අනු අංකය* | *පුවරුවේ ස්වභාවය* | *වර්ග මීටර් ප්‍රමාණය* | *ගාස්තුව රුපියල්* | | |
|---|---|---|---|---|---|
| | | | *මාස 03ට අඩු* | *මාස 3 හෝ 06 අතර* | *වසරක්* |
| 01 | කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 02. | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 3ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 3ට වැඩි | 3ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 03. | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින් | | |
| 04. | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින් | | |
| 05. | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 06. | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින් | | |
| 07. | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 750/- | 850/- | 1000/- |
| | | 1ට වැඩි | 1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500/- බැගින් | | |

**සත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) (ද) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මස් පිණිස, කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස පවත්වාගෙන යන්නාවූ සත්ව ගොවිපල විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, එමගින් සිදුවන මහජන පීඩාවන් පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සත්ව ගොවිපළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තෙකු විසින් කවර හෝ සත්ව ගොවිපොළක් මස් පිණිස, කිරි ලබාගැනීම පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස පවත්වාගෙන නොයා යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 1 වන උපලේඛනයට අදාළව විය යුතු අතර සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියන් මගින් තීරණය කර අයකරන ලබන ගාස්තු ගෙවා එම ඉල්ලුම්පත්‍රය සභාව වෙතින් ලබා ගත යුතුය.

06. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන්නේය.

07. බලපත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණ කර ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේය.

08. බලපත්‍ර ලත් සෑම සත්ව ගොවිපළකට "බලපත්‍රලත් සත්ව ගොවිපළ" යන පරිදි සහ බලපත්‍රධාරියාගේ නමද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් යටතේ සත්ව ගොවිපොළෙහි බාහිරට පෙනෙන පරිදි සඳහන් කර ප්‍රකටව පෙනෙන ස්ථානයක සඳහන් කර තැබිය යුතුය.

09. සෑම සත්ව ගොවිපළක් සඳහා පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස ඒ සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

*(අ).* සෑම බලපත්‍රධාරියෙක්ම ගොවිපොළ හා එහි සියලු ගොඩනැගිලි මනා අලුත්වැඩියාවෙන්ද පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන්ද තබාගැනීමට සහ එය දිනපතා සේදීමට සහ ඇමදීමට සැලැස්විය යුතුය.

*(ආ)* ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත තත්වයෙන් තබාගත හැකි වනු පිණිස සියළු සත්ව මළමුත්‍ර හා වෙනත් අපද්‍රව්‍ය දිනපතා වරින් වර හා කෙටි කාල සීමාවකට වරක් බැගින් එකතු කිරීමට සැලැස්විය යුතු අතර, එසේ එකතු කරන සත්ව මළ මුත්‍ර හා අපද්‍රව්‍ය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තැනූ ආවරණය කරන ලද භාජනයකට හෝ සිමෙන්ති බදමයෙන් බැඳ කපරාරු කරන ලද ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති වලකට දැමිය යුතුය.

*(ඇ)*සියළු අපද්‍රව්‍ය මුත්‍රා හෝ සේදූ ජලය දිනකට යටත් පිරිසෙයින් එක් වරක් වත් ඉවත් කර ඒවා මගින් පීඩාවක් ඇති නොවන පරිදි බැහැර කිරීමට සැලැස්විය යුතුය.

*(ඈ)* සෑම සත්ව ගොවිපළ බලපත්‍රධාරියෙකුම අවම ලෙස මාස 3කට වරක් ගොවිපලේ සෑම සත්වයෙකුම රජයේ පශු වෛද්‍යවරයාගේ පරීක්ෂාවට ලක්කර ලබාගත් වාර්තාවක් තමා භාරයේ තබා ගත යුතු අතර, පශු වෛද්‍යවරයා විසින් යම් නිර්දේශයක් ලබා දී ඇත්නම් එම නිර්දේශ වහාම ක්‍රියාත්මක කළ යුතුය.

*(ඉ)* සත්ව ගොවිපළ තුළ සිටින සතෙකුට හෝ සතුන්ට යම් රෝගයක්, බෝවන රෝගයක් වසංගත තත්වයක් ලෙස ඇති වුවහොත් සත්ව ගොවිපළ තුල එම සතුන් වෙන්කොට තැබීමට හැකි වන ලෙස ගොවිපළ නිර්මාණය කර පවත්වාගෙන යා යුතුය.
*(ඊ)* සත්ව ගොවිපළ තුල සතුන්ට යම් රෝගී තත්ත්වයක්, බෝවන රෝගයක්, වසංගත තත්ත්වයක් ගොවිපළ තුල ඇති වුවහොත් එවැනි අවස්ථාවකදී ඒ බව ප්‍රදේශයේ පශු වෛද්‍යවරයාට ලිඛිතව දැනුම් දීමක් කළ යුතුය.

10. සත්ව ගොවිපළ තුල සතුන් රඳවා තබා සිටින ස්ථානයකදී බලපත්‍රලාභියා හෝ වෙනත් කවර හෝ තැනැත්තෙක් කිසිදු සතෙකු මැරීම හෝ සතෙකුට වධහිංසා පැමිණවීම නොකළ යුතුය.

11. සත්ව ගොවිපළ තුල යම් රෝගයකින්, බෝවන රෝගයකින් හෝ වසංගත තත්වයක් හේතුවෙන් මිය යන සතෙකුගේ මස් මනුෂ්‍ය පරිභෝජනයට ලක්විය නොහැකි පරිදි විනාශ කළ යුතුය.

12. සභාපතිවරයා විසින් හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් සත්ව ගොවිපලකට යුක්ති සහගත වේලාවන් තුළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

13. සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා විසින් හෝ සත්ව ගොවිපල භාරව සිටින තැනැත්තා විසින් හෝ ඉඩදෙනු ලැබිය යුතු අතර, සභාපතිවරයා හෝ එවැනි නිලධාරියෙකුට හෝ අවශ්‍ය විය හැකි සියලුම සහාය දිය යුතුය.

14. බලපත්‍රලාභියෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්ති උල්ලංඝනය වන පරිදි ක්‍රියා කිරීමේදී හා එහි උල්ලංඝනය සම්බන්ධයෙන් දැනුම්දීමෙන් අනතුරුව තවදුරටත් උල්ලංඝනය වන විටදී සභාපතිවරයා විසින් බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

15. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියමකර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ –

"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"බලය ලත් නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"සතුන්" යන්නෙන් මස් පිණිස හෝ කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස ඇති කරන කවර සත්ව කොට්ඨාසයන් ද,

"සත්ව ගොවිපළ" යන්නෙන් ගවයන් සම්බන්ධයෙන් වන විටදී ගවයන් 05ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ද එළුවන් සම්බන්ධයෙන් වන විටදී එළුවන් 05ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ද කුකුළන් සම්බන්ධයෙන් වන විටදී කුකුළන් 50 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ද ඌරන් සම්බන්ධයෙන් වන විටදී ඌරන් 05ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ද අදහස්වේ.

## *I වන උපලේඛනය*

*සත්ව ගොවිපල බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම :–
2. අයදුම්කරුගේ ලිපිනය :–
3. දුරකථන අංකය :– විද්‍යුත් තැපැල් ලිපිනය :–
4. ගොවිපල පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය :–
5. දිස්ත්‍රික්කය :–
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :–
7. ගොවිපල පිහිටි ග්‍රාම නිලධාරි වසම / ගම :–
8. ඇති කරන සතුන් වර්ගය හා ප්‍රමාණයන් :–

| *අනු අංකය* | *සත්ව වර්ගය* | *ප්‍රමාණය* | *සතුන් ඇති කරන අරමුණ (මස් පිණිස/වෙනත් .......)* | *සතුන් සඳහා වෙන් කරදී ඇති ඉඩ ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | ගවයන් | | | |
| 02 | එළුවන් | | | |
| 03 | ඌරන් | | | |
| 04 | කුකුළන් | | | |

9.පහත සඳහන් ලේඛන අමුණා ඇත.

(අ) ස්ථානය සම්බන්ධයෙන් පශු වෛද්‍ය නිලධාරි වාර්තාව

(ආ) ගොවිපළට යන මාර්ග විස්තරය සම්බන්ධයෙන් දළ සැළැස්මක්

........................................................................ ..................................................................

දිනය අයදුම්කරුගේ අත්සන

කාර්යාල ප්‍රායෝජනය සඳහා

*(අ)* ප්‍රාදේශීය සභා පරිසර නිලධාරි වාර්තාව :–

*(ආ)* ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ වාර්තාව :–

ඉහත සඳහන් තොරතුරු හා වාර්තාව අනුව සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි/නොකරමි.

.................................................................. ..................................................................

දිනය ලේකම්

සත්ව පාලන ඒකකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම අනුමත කරමි/නොකරමි.

.................................................................. ..................................................................

දිනය සභාපති

### කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 VII (ඌ) උපවගන්තිය යටතේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම, එය පාලනය කිරීම, හා විධිමත් කිරීම සහ ඒ සඳහා ගාස්තු අයකර ගැනීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව කුලී රථ වාහන නැවතුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ස්ථාන වල හැර (මෙහි මින් මතු රථ නැවතුම් පොළ යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණු ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කළ හැකි අතර එයද ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉහත 4 වන වගන්තිය යටතේ ප්‍රකාශිත රථ නැවතුම්පොළක කුලි රථ නවතා තැබීමේදී අයකල යුතු ගාස්තු, අවසර ලබාදෙන කාලය ද සැළකිල්ලට ගනිමින් සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කිරීම නිත්‍යානුකූල වන්නේය.

6. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ ප්‍රකාශිත රථ නවතුම් පළක, මෝටර් රථ වාහනයන් නවතා තැබීම, ඊට ඇතුල් නොකළ යුතු අතර, මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසරපත්‍රයක්ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුයේ කවර කාල සීමාවක් සඳහා ද, එය එම කාලසීමාව දක්වා අදල විය යුතු අතර එය වාර්ෂික අවසර පත්‍රයක් වන විටදී අදල ලිත් වර්ෂයෙහි දෙසැම්බර් මස 31 ව දිනෙන් අවසන් විය යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ රථ නැවතුම් පොළක මෝටර් වාහනයක් නවතා තැබීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීමට මසකට වඩා වැඩි කාල සීමාවක් වෙනුවෙන් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි 1 වන උපලේඛනය යටතේ වූ ආකෘතියට සාරානුකූලව ඉල්ලුම් කළ යුතු අතර, ඉල්ලුම්කරනු ලබන රථ නැවතුම්පලෙහි ඒ සඳහා පහසුකම් සැපයීමට ඇති ඉඩ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අදල අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

9. කුලී රථ නැවතුම් ස්ථානයක මෝටර් වාහනයක් නවතා තැබීම සඳහා නියමිත මුදල් ගෙවා ඇත්තේ නම් මිස ඒ සඳහා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය. රථ නැවතුම් පලක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු හෝ පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටින ඕනෑම විටක එය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

10. කුලී රථ නැවතුම් පළක වාහනය නවතා තැබීම සඳහා වන වාර්ෂික අවසර පත්‍රයක් ජනවාරි 31 දිනට පෙර ඉල්ලුම්කර ලබාගත යුතුය.

11. සෑම කුලී රථ නැවතුම්පළක මෝටර් රථයක් නවතා තැබීම සඳහා ඉඩ ප්‍රමාණයන් සුදු හෝ කහ පැහැති වර්ණ ගන්වන ලද සෙන්ටිමීටර් 13 පළලින් යුත් තීරු මගින් වෙන්කර තිබිය යුතු අතර අදල තීරු අතර සිටින සේ වාහනය නවතා තැබීම කළ යුතුය.

12. කුලීරථ වාහන නැවතුම්පළ තුළදී කිසියම් වාහනයක් එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහන් කළ යුතු අවම අළුත්වැඩියාවන් හැර කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීමක් හෝ සේදීම හෝ නොකළ යුතුය.

13. යම් තැනැත්තෙකු කුලී රථ නැවතුම්පොළක හෝ එහි නවතා ඇති වාහනයක් ඇතුලත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හැසිරීම හෝ අන්‍යයන්ට හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතුය.

14. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන

ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

15. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට/හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ අවසර පත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ :

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද ;
"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා ද ;
"බලය පවරනු ලැබූ නිළධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද ;
"මෝටර් රථය හෝ කුලී රථය හෝ වාහනය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත්ට්‍රැක්ටරයක් ද,
"පොලිස් නිලධාරියා" යන්නෙන් පොලිස් ආඥාපනතේ ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති අර්ථය ද අදහස් වන්නේය.

*උපලේඛන අංක - 01*

**කුලී රථ නැවතුම් ස්ථානයක් සඳහා වන අවසර පත්‍රය සඳහා අයදුම්පත්‍රය**

01. වාහනයේ අංකය : ————— ;
02. වර්ගය : ————— ;
03. අයිතිකරුගේ නම හැඳුනුම්පත් අංකය : ————— ;
04. අයිතිකරුගේ දුරකථන අංකය : ————— ;
05. ලිපිනය : ————— ;
06. රියදුරුගේ නම : ————— ;
07. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : ————— ;
08. රියදුරු බලපත්‍ර අංකය : ————— ;
09. ලිපිනය : ————— ;
10. වාහනය නවතා තැබීමට ඉල්ලුම් කරන ස්ථානය : ————— ;
11. වාහනය භාවිතා කරනු ලබන්නේ කුමන කාර්යයක් සඳහාද : ————— ;
12. වාහනයේ ධාරිතාව/ආසන සංඛ්‍යාව : ————— ;

ඉහත තොරතුරු සත්‍ය නිවැරදි බව සහතික කරමි

..........................................
අයිතිකරු/රියදුරු.

දිනය: —————.
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
ආදායම් පරීක්ෂකගේ වාර්තාව

1. නැවතුම් පොළ පිළිබඳ විස්තර : ————— ;
2. බලපත්‍ර ගාස්තුව : ————— ;

අවසර පත්‍රය ලබාදීම නිර්දේශ කරමි./පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

..........................................
ආදායම් පරීක්ෂක.

දිනය: —————
ලේකම්ගේ නිර්දේශය
අවසර පත්‍රය ලබාදීම නිර්දේශ කරමි./පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.
දිනය: —————. ..........................................
ලේකම්

ඉහත වාර්තාව අනුව අවසර පත්‍රය ලබාදීම අනුමත කරමි./නොකරමි.

සභාපති,
.................................... ප්‍රාදේශීය සභාව,

දිනය :-

## මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)/(ඒ) වගන්තිය යටතේ බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පරීක්ෂා කිරීම හා මස් විකුණන ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

   (අ) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් අල්ලා හෝ කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා සාදා තිබිය යුතු ය.

   (ආ) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

   (ඇ) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්லූ කාණු තිබිය යුතු ය.

   (ඈ) (ඇ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

   (ඉ) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

   (ඊ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

   (උ) අලෙවිය සඳහා මස් එල්ලා තබන හෝ ප්‍රදර්ශනය කරන කොටස මහජනයාට එකවර පහසුවෙන් දර්ශනය නොවන ආකාරයට සකස් කර තිබිය යුතුය.

6. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතාකාගාරයේ දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා තබා ගැනීම හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. බලපත්‍රලාභී කවර හෝ මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මස් කැපීම සඳහා ගන්නා ලී කොට ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

8. මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අපද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බැහැර කිරීම කළ යුතු ය.

9. බලපත්‍රලාභී කවර හෝ මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම්, හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

11. කවර හෝ ගෝ ඝාතාකාගාරයක් තුළ කිසියම් දිනයක දී හෝ කාල වකවානුවක මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, කවර හෝ මස් වෙළඳසැලක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම හෝ නොකළ යුතු ය.

12. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක් බල්ලන්, බළලුන්, මීයන්, කෘමින් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

13. සෑම මස් වෙළඳසැලකම බලපත්‍රධාරියා විසින් මස් වෙළඳාම තහනම් කරන දිනක හැර අන් සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා මාංශ අලෙවිය සඳහා විවෘතව තැබිය හැක.

14. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

15. බලපත්‍ර ලත් ස්ථානයෙහි කිසිදු සතකු හෝ පක්ෂියකු තබා නොගත යුතුය.

16. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ භාවිතයට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතුය.

17. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ඇ)* මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එකී සේවකයන්ගේ නම්, ලිපිනයන් හා ජාතික හැඳුනුම්පත් අංක සහිත ලේඛනයක් බලපත්‍රලත් ස්ථානයේ තබා ගත යුතුය.

19. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුත්ක සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

20. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන අතර බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

21. බලපත්‍රධාරියා විසින් එම වෙළඳ ස්ථානයෙහි ඔහුගේ නම, ලිපිනය, බලපත්‍ර අංකය සමග බලපත්‍රලත් මස් වෙළඳ සැළක් වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසී භාෂාවලින් යුත් නාම පුවරුවක් සවිකර තිබිය යුතුය.

22. බලපත්‍රලත් ස්ථානයක;

(1) ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය/ ජෛවභායන අපද්‍රව්‍ය හා ජෛවභායන නොවන අපද්‍රව්‍ය වශයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ වසා තැබිය හැකි භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(11) ඉහත (i) උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට නිසි කාලය තුළ මස් වෙළඳ සැලට ඇතුල්වීම, පරීක්ෂා කිරීම, සාම්පලයක් මිලදී ගැනීම නීත්‍යානුකූල වන්නේය.

24. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 5 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

25. 24 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

26. 24 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දිර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

27. මේ අතුරු ව්‍යස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"සභාපති " යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය " යන්නෙන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශයද,

"නිසි කාලය" යන්නෙන් මස් වෙළඳ සැලක මස් අලෙවි කරන හෝ ප්‍රදර්ශනය කරන, මස් ගබඩා කර විවෘතව තබා ඇති ඕනෑම වෙලාවක්ද,

"මස්" යන්නෙන් ගෝ ඝාතක ආඥා පනත යටතට ගැනෙන සතෙකුගේ මාංශ කොටස් හෝ ශරීර කොටස් ද අදහස්වේ.

**පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික ඉගැනුම් ආයතන පවත්වාගෙන යන ගොඩනැගිලි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලබයි.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියළුම පෞද්ගලික ඉගෙනුම් ආයතන පවත්වාගෙන යන එහි හිමිකරුවෙකු, භාරකරුවෙකු විසින් සභාපතිවරයා වෙතින් තත්කාර්ය සඳහා ලබාගත් බලපත්‍රයක් නොමැතිව පෞද්ගලික ඉගෙනුම් ආයතනයන් පවත්වාගෙන නොයා යුතු ය.

05. ඉහත 4 වන වගන්තිය යටතේ සඳහන් බලපත්‍රය ලබා ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වන උප ලේඛනය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත ලියවිලි ද සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*(අ).* අදාළ ගොඩනැගිල්ලේ අනුමත සැලැස්ම.
*(ආ).* අභ්‍යන්තර පිරිසැකැස්ම.
*(ඇ).* උපයෝගී කරගන්නා තාක්ෂණික උපකරණ පිළිබඳ විස්තර.

06. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු සභාව විසින් වාර්ෂිකව යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර තිබිය යුතුය.

07. ඉහත 4 වගන්තිය යටතේ ලබා ගනු ලබන බලපත්‍රය කලින් අවලංගු කරන ලද්දේ නම් මිස ලබා ගන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන්නේ ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම එසේ ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය.

*(අ)* දේශන ගොඩනැගිල්ලේ දිග මීටර් 15 හෝ ඊට වඩා වැඩිවන විට දේශකයා පසුපසට දර්ශනය වන ලෙස මීටර 0.5 උසැති වේදිකා පහසුකමක් අදාළ දේශකයා සඳහා ලබාදිය යුතුය.

*(ආ)* දේශන ගොඩනැගිල්ලේ දිග මීටර් 15 හෝ ඊට වඩා වැඩි වන අවස්ථාවක ප්‍රමාණවත් වන පරිදි ශබ්ද විකාශන පහසුකම් සපයා තිබිය යුතු ය.

*(ඇ)*ගොඩනැගිල්ල තුළ ප්‍රමාණවත් පරිදි ගිනිනිවීම් උපකරණ සවිකර තිබිය යුතු අතර, සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය සපයන ලද නිළධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලබන ඕනෑම අවස්ථාවක ක්‍රියාත්මක තත්වයේ පැවතිය යුතු ය.

*(ඈ)* ඇතුල්වීම හා පිටවීම වශයෙන් දෙරටු සකස් කර තිබිය යුතු අතර ළමුන් 100 කට වැඩි නම් හදිසි අවස්ථාවක දී පිටවීම සඳහා අතිරේක පිටවීම දෙරටුවක් සකසා තිබිය යුතු ය.

*(ඉ)* දේශන ගොඩනැගිල්ලේ ඇතුලත බිත්ති වල බිම සිට මීටර් 1 ට වඩා ඉහල කොටස සුදු තීන්තයෙන් ආලේප කර තිබිය යුතු ය.

*(ඊ)* අවම වශයෙන් වසරකට වරක් හෝ සභාපතිවරයා විසින් එසේ කළ යුතු යැයි නියම කරනු ලබන අවස්ථාවක බිත්ති වල තීන්ත ආලේප කළ යුතු ය.

*(උ)* ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් ගොඩනැගිල්ල තුළ සපයා තිබිය යුතුය.

*(ඌ)* දේශන ගොඩනැගිල්ලේ දෙපස බිත්ති වල වර්ග ප්‍රමාණයෙන් අවම වශයෙන් 1/4 ක ප්‍රමාණයක් ආවරණය වන පරිදි වාතාශ්‍රය හොඳින් ලැබෙන සේ වාකවුළු සකස් කර තිබිය යුතු ය.

*(එ).* දේශන ගොඩනැගිල්ල අවට පරිසරය නිරන්තර පිරිසිදු තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, කැලි කසල බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් කසල බඳුන් සංඛ්‍යාවක් ශාලාවෙන් පිටත තබා තිබිය යුතු ය.

*(ඒ)* ගැහැණු පිරිමි වශයෙන් වෙන් වෙන්ව වැසිකිළි හා කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, අවම වශයෙන් සිසුන් 50 දෙනෙකුට එක් වැසිකිළියක් බැගින් වන සේ අදාළ පහසුකම් සපයා තිබිය යුතු ය. එම වැසිකිළි හා කැසිකිළි සුදුසු විෂබීජ නාශකයන් භාවිතා කර දුර්ගන්ධය වහනය නොවන ආකාරයෙන් නිරන්තර පිරිසිදු තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. ප්‍රමාණවත් ජල පහසුකම් ක්‍රියාත්මක තත්වයේ තිබිය යුතු ය.

*(ඔ)* ශිෂ්‍යයන් 50 දෙනෙකුට එක් පානීය ජල කරාමය බැගින් ප්‍රමාණවත් පානීය ජල පහසුකම් සපයා තිබිය යුතු ය.

*(ඕ)* සිසුන් සඳහා සෙන්ටිමීටර 50ට නොඅඩු උසකින් යුත් පිටුපසට ඇඳි සහිත සෙ. මී. 30ට නොඅඩු පළලකින් යුත් ආසන පැනවිය යුතු ය. එක් එක් සිසුන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ආසන නොපනවන්නේ නම්, එම ආසන දිගින් අවම වශයෙන් සෙන්ටිමීටර 60 ක් එක් සිසුවෙකු වෙනුවෙන් වෙන්විය යුතු ය.

*(ක)* සිසුන් සඳහා අවම වශයෙන් සෙන්ටිමීටර් 60 ක් දිගින් සෙන්ටිමීටර් 45 ක් පළලින් යුත් මේසයක් බැගින් සැපයිය යුතු ය. එක් එක් සිසුන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මේස නොපනවන්නේ නම් පනවනු ලබන මේසයේ දිගින් අවම වශයෙන් සෙන්ටිමීටර් 60ක ප්‍රමාණයක් එක් සිසුවකු වෙනුවෙන් වෙන් විය යුතු ය. මේසයක උපරිම දිග මීටර් 3.5 ක් විය යුතු ය.

*(ග)* දේශන ශාලාවේ ආසන හා මේස ස්ථානගත කිරීමේදී මේස දෙකක් අතර අවම පරතරය සෙන්ටිමීටර් 60ක් විය යුතුය.

*(ච)* සෑම අවස්ථාවකම සිසුන් සඳහා පනවා ඇති ආසන හා මේස භාවිතයට සුදුසු තත්වයෙන් තිබිය යුතු ය.

9. සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා බලය පැවරූ නිලධාරියෙකු විසින් හෝ සියලු යුක්ති සහගත වේලාවක දී කවර හෝ පෞද්ගලික ඉගෙනුම් මධ්‍යස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පෞද්ගලික ඉගෙනුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටුකරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

11. 10 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතුය.

12. 10 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින්අවලංගු කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ වගන්තියක් හෝ කීපයක් හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩාව තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක උපරිම දඩයක් පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

''සභාව'' යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,

"සභාපති " යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද ,

''පෞද්ගලික ඉගෙනුම් ආයතනය'' යන්නෙන් ශිෂ්‍යයන්ගෙන් මුදල් අය කර පවත්වාගෙන යනු ලබන අතිරේක ඉගෙනුම් ආයතනයක් ද අදහස් කෙරේ.

***I** වන උපලේඛනය*

පෞද්ගලික ඉගැනුම් ආයතනයක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම :-
2. ලිපිනය :-
3. හැඳුනුම්පත් අංකය :-
4. දුරකථන අංකය :-

5. අධ්‍යාපන ආයතනයේ නම :-
6. ලිපිනය :-

7. ලියාපදිංචි අංකය :-

8. ඉදිරිපත් කර ඇති ලේඛන :-

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | ගොඩනැගිලි සැලැස්ම | ඇත | ☐ | නැත | ☐ |
| II. | පිරිසැකැස්ම | ඇත | ☐ | නැත | ☐ |
| III. | තාක්ෂණික උපකරණ | ඇත | ☐ | නැත | ☐ |

9.වෙනත් විස්තර :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන - ................................ දිනය - ..............................................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| | | |
|---|---|---|
| විෂය ලිපිකරු | නිවැරදි ☐ | වැරදි ☐ |
| ගොඩනැගිලි අයදුම්පත්‍රය | | |
| ආදායම් පරීක්ෂක / පිරිසැකැස්ම | නිවැරදි ☐ | වැරදි ☐ |

බලපත්‍රය නිකුත් කිරීම සුදුසු වේ.

අත්සන 1........................................

2.......................................

බලපත්‍රය නිකුත් කිරීම සුදුසු බව නිර්දේශ කරමි/නොකරමි.

...............................................
ලේකම්,

අනුමත කරමි/නොකරමි.

...............................................
සභාපති.

### ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(xi) (එ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පොදු ගෝ ඝාතක ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම හා ඒ සඳහා ගාස්තු නියම කිරීම සඳහා පනවනු ලැබේ.

3. අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටුවා ඇති ගෝ ඝාතක ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින් වේ.

4. සෑම ගෝ ඝාතකාගාරයක්ම ඝාතකාගාර භාරකරුවෙකුගේ භාරකාරිත්වය යටතේ පැවතිය යුතුය.

5. නිසි බලධාරීන් විසින් කළින් කළ නියම කරනු ලැබිය හැකි වේලාවන් තුළ පමණක් හැර, ගෝ ඝතාගාරය තුළ කිසිම බලපත්‍රලත් ඝාතකයෙකුට සතුන් ඝාතනය කිරීමට ඉඩදෙනු නොලැබිය යුතු ය.

6. බලපත්‍රලත් ඝාතකයෙකු විසින් සතුන් ඝාතනය කළ යුත්තේ ඝාතකාගාර භාරකරු විසින් ඒ ඝාතකයාට ඝාතකාගාරය ඇතුළත ඒ සඳහා වෙන් කරදෙනු ලැබූ ස්ථානවලදී පමණක් විය යුතු ය.

7. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් යම් සතෙකු පරීක්ෂා කර එම සතා මරණයට පත්කිරීම සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නිකුත් කර ඇත්නම් මිස කිසිම සතෙකු ඝාතනය නොකළ යුතුය.

8. ඉහත 07 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් එම සහතිකය නිකුත් කරන ලද දින සිට දින 07 ක් දක්වා පමණක් වලංගු වන්නේය.

9. ඝාතනය කරන සෑම සතෙකු සම්බන්ධයෙන්ම එම සතාගේ පූර්ව අයිතිය සනාථ කෙරෙන ලියවිල්ලක් තමා භාරයට පත් වී තිබිය යුතු අතරම එම සතා සම්බන්ධයෙන් ස්වභාවය හා පූර්ව අයිතිය පිළිබඳ තොරතුරු මෙන්ම ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ ආකෘති පත්‍රයක දක්වෙන පරිදි වූ වෙනත් සියළු විස්තර ද ඇතුළත් ලේඛනයක් ඝාතකාගාර භාරකරු විසින් තමා භාරයේ පවත්වා ගත යුතුය.

10. ගෝ ඝාතනාගාරයට සතෙකු ඇතුළත් කිරීමට පෙරාතුව පහත සඳහන් සනාථ කිරීම් ඝාතකාගාර භාරකරු වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන යම් අයෙකුට සතෙකු ඇතුල් කිරීමට අවසර නොදිය යුතුය.

(අ). අනන්‍යතා සහතිකය
(ආ). යෝග්‍යතා සහතිකය
(ඇ). අවසර පත්‍රය

11. ඝාතකාගාරයට ගෙන එනු ලබන හෝ එහි රඳවා තබන සතුන් පැනයාම වැළැක්වීම පිණිස කඹවලින් නිසි පරිදි බැඳ තැබිය යුතු අතර නැතහොත් වෙනත් ආරක්ෂක පියවර ගෙන තිබිය යුතුය.

12. ඝාතකයකු වශයෙන් තමාගේ ව්‍යාපාරය හා සම්බන්ධ ඝාතකාගාරයෙහි සේවයේ නියුක්ත කිරීමට අපේක්ෂා කරන සේවකයන්ගේ නම්, සෑම බලපත්‍රලත් ඝාතකයකු විසින්ම ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ලේඛනගත කළ යුතු අතර, කිසියම් නමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ වන විටත් ලියාපදිංචි කර ඇති අය අතුරෙන් කිසිවකුගේ නම අවලංගු කිරීම හෝ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් කරනු ලැබිය හැකිය. එසේ ලියාපදිංචි කරනු නොලැබූ හෝ එසේ නම අවලංගු කරනු ලැබූ කිසිම තැනැත්තෙකු එවැනි බලපත්‍රලත් ඝාතකයෙකු විසින් සේවයේ නියුත්ක කිරීම හෝ සේවයෙහි තබා ගැනීම නොකළ යුතුය.

13. සෑම බලපත්‍රලත් ඝාතකයෙකු විසින්ම ඔහුගේ බලපත්‍රයේ සහතික කළ පිටපතක් සහ ඔහු විසින් ඝාතකාගාරයේ සේවයේ නියුක්ත කරන සෑම සේවකයකුගේම නම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඒවා ලබාගත් වහාම, ඝාතකාගාර භාරකරු වෙත භාරදිය යුතුය.

14. ඝාතනය කරන ලද සතුන්ගේ සම් බඩවැල් සහ ඉවත දමන ලද කොටස් ඝාතක විසින් හෝ ඔහුගේ සේවයේ නියුක්තිකයන් විසින් ඉවත් කිරීමට පෙර සෝදා පිරිසිදු කිරීම පිණිස ද ඒ සඳහා වෙන්කර ඇති ස්ථානවල එකතු කළ යුතුය.

15. බලපත්‍ර ලත් ඝාතකයෙකු හෝ ඔහුගේ ලියාපදිංචි කළ සේවකයන් විසින් ඝාතකාගාරය පාවිච්චි කරන විටදී ඔහුගේ ක්‍රියාවන්ගෙන් හෝ ඔහුගේ සේවකයන් කිසිවෙකුගේ ක්‍රියාවන්ගේ හේතුවෙන් ඝාතකාගාරයට සිදුවන යම් අලාභානියක් සම්බන්ධයෙන් බලපත්‍ර ලත් ඝාතකයා වගකිය යුතු අතර, ඒ සඳහා අලාභය බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් සභාපතිවරයා විසින් බලපත්‍රය අවලංගු කිරීම හෝ විකල්පයක් වශයෙන් ඒ අලාභ හානියේ මුදල බලපත්‍රලත් ඝාතකගෙන් හෝ ඔහුගේ ඇපකරුවන්ගෙන් අය කිරීම හෝ ඒ දෙයාකාරයෙන් හෝ කරනු ලැබිය හැකිය.

16. යම් චර්ම රෝගයකින් හෝ ලාදුරු රෝගයකින් හෝ යම් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙකුට ඝාතකාගාරයට ඝාතකාගාර භාරකරු විසින් ඇතුල්වීමට ඉඩ නොදිය යුතුය.

17. සතුන් සම්බන්ධයෙන් එක් සතෙකු වෙනුවෙන් මෙහි පහත දැක්වෙන කාර්යය සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කර අයකිරීම නීත්‍යානුකුල වන්නේය.

(1) ඝාතකාගාර පාවිච්චි කිරීම සඳහා

(අ) ගවයන්
(ආ) ඌරන් සහ එළුවන්

(2) ගවයන්ට කෑම දීම (පැය විසි හතරක කාලයක් හෝ ඉන් කොටසක් සඳහා)

(අ) ගවයන්
(ආ) ඌරන් සහ එළුවන්

(3) මඩුව පාවිච්චි කිරීම සඳහා

(අ) ගවයන් සඳහා
(ආ) ඌරන් සහ එළුවන්

18. අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් ඝාතකාගාරයේ රඳවා ගන්නා ලද සතකු ඒ සම්බන්ධයෙන් දැනුම් දීමකින් අනතුරුව තවදුරටත් අදල ගාස්තු නොගෙවන්නේ නම් දවස් දෙකකට කලින් ප්‍රචාරයක් කිරීමෙන් පසුව සභාපතිවරයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ එම සතා විකිණීමට සැලැස්විය හැකිය. එසේ විකිණීමෙන් ලැබෙන මුදලින් ඒ සතා වෙනුවෙන් අයවිය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය තමා වෙත රඳවා තබාගෙන ඉතිරි මුදලක් වේතොත් එය ඒ සතා ඝාතනය කිරීම සඳහා ඝාතකාගාරයට ගෙන ආ තැනැත්තාට ඔහු විසින් ඉල්ලුම් කරනු ලැබීමෙන් අනතුරුව සභාපති විසින් ගෙවනු ලැබිය යුතු ය. වෙන්දේසියේ විකිණීමෙන් වර්ෂයක් ඇතුළත දී අදාළ මුදල ලබා ගැනීමට හඳුනාගත් ඝාතකාගාරයට ගෙන ආ තැනැත්තා විසින් ඉල්ලුම් කිරීමට අපොහොසත් වුවහොත් එම මුදල සභා අරමුදලට බැර කළ යුතුය.

19. රෝගීව සිටීම හෝ අන් හේතුවක් නිසා හෝ මනුෂ්‍ය ආහාරය සඳහා ඝාතනය කිරීමට සුදුසු නොවන බවට හඳුනාගනු ලැබූ සතෙකු ඝාතනය කිරීමට ඒ වන විට අවසර පත්‍රයක් නිකුත් කර තිබුනේ වුවද ඒ සතා ඝාතනය කිරීමට ඝාතකාගාර භාරකරු විසින් හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍යවරයා /නිලධාරිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරයෙකු විසින් හෝ තහනම් කිරීම නිත්‍යානුකුල වන්නේය.

20. ඝාතනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ ඝාතනය කිරීම තහනම් කරනු ලැබූ සතකු ඝාතකාගාරයට ගෙන ආ තැනැත්තා එසේ අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ ඝාතනය තහනම් කරනු ලැබ පැය දොළහක් ඇතුලත එම සතා ඝාතකාගාරයෙන් ඉවත් කර ගැනීම පැහැර හැරියහොත් 18 වන වගන්තියෙන් දැක්වෙන විධිවිධායන් අනුව ක්‍රියා කළ යුතු ය.

21. සභාව විසින් අනුමත කළ ආකෘතියක් යටතේ සභාපති හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පතක් ඇතිව මිස පොදු ඝාතකාගාරයක ඝාතනය කළ කිසිම සතෙකුගේ මස්, හම, බඩවැල් හෝ අවමස් කිසිම තැනැත්තෙකු විසින් ඉවත් කරගෙන නොයා යුතුය. එවැනි මස්, හම්, බඩවැල් හෝ අවමස් ඉවත්කරගෙන යන යම් තැනැත්තෙකු වෙතින් ඊට අදල අවසර පත්‍රය ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටි විටදී ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

22. කිසිම සුනඛයෙකු ඝාතකාගාරය තුළට ගෙන ඒමට ඉඩ නොදිය යුතු අතර කිසියම් සුනඛයෙකුගේ අයිතිකරු හෝ භාරව සිටින තැනැත්තෙකු විසින් එසේ සුනඛයෙකු ඝාතකාගාරයට ගෙන ඒම හෝ සුනඛයෙකුට ඝාතකාගාරයට ඇතුල්වීමට ඉඩ හැරීම හෝ නොකළ යුතුය. ඝාතකාගාරයක සිට හමුවන සියළු සුනඛයන් දඩාවතේ යන සුනඛයන් ලෙස සළකා ක්‍රියා කළ යුතුය.

23. කිසිම බලපත්‍රයක් ලත් ඝාතකයකු හෝ ඝාතකයකුගේ ලියාපදිංචි කළ යම් සේවකයෙකු හෝ ඝාතකාගාරය තුළට පැමිණීමට ඉඩදෙන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් ඝාතකාගාරය තුළ යම් ශබ්ද නැගීම කෝලාහල කිරීම හෝ දබර කිරීම අපහාසාත්මක අපවාදාත්මක හෝ අශිෂ්ඨ වචන පාවිච්චි කිරීම නොකළ යුතුය.

24. නිසි බලධාරියාගෙන් විශේෂයෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇත්නම් මිස බලපත්‍ර ලත් ඝාතකයෙකු නොවන කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත කිසිදු සතෙකු ඝාතනය කිරීමට නීත්‍යානුකූල නොවන අතර එවැනි විශේෂ බලපත්‍රයක් ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් ද ඒ බලපත්‍රයේ සඳහන් ස්ථානයේදී හෝ එහි දක්වෙන කොන්දේසි යටතේ හැර ඒ ඝාතනය සිදු නොකළ යුතුය. එවැනි විශේෂ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක ඝාතනය කිරීමට ඇති සතා සම්බන්ධයෙන් (473 වැනි අධිකාරිය වන) ගවයන් හංවඩු ගැසීම, විකිණීම සහ පැවැරීම පිළිබඳ ආඥාපනතේ උපලේඛනයේ ''අ'' ආකෘතියට හා සමානව විස්තර ඇතුළත් වියයුතු අතර, ඉල්ලුම්කරුට ඒ සතා අයත් බවට ඉල්ලුම්කරුගේ ප්‍රදේශයේ පොලිස් නිලධාරියෙකුගේ හෝ ග්‍රාමසේවා නිලධාරියාගේ හෝ වාර්තාවක් ඒ සමග විය යුතුය. මෙම විශේෂ බලපත්‍රය සඳහා රුපියල් දෙසිය පනහක (රු.250/-) නොඉක්මවන හෝ සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.

25. සෑම ඝාතකාගාරයක්ම දිනකට දෙවරක්වත් සෝද පිරිසිදු කළ යුතු අතර, මනා නඩත්තුවක් යටතේ එය පවත්වාගෙන යාම ඝාතකාගාර භාරකරුගේ කාර්ය විය යුතුය.

26. ඝාතනය සඳහා ඉහත කී පරිදි අනුමත කරන යම් සතෙකු ඝාතනය කිරීමෙන් පසුව එම සතාගේ මළ කඳ රෝගයකට පාත්‍රවී ඇති බව හෝ මනුෂ්‍ය ආහාරය සඳහා අයෝග්‍ය බව පෙනී ගියහොත් සභාපතිවරයා විසින් හෝ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් මනුෂ්‍ය ආහාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස බැහැර කිරීමට සැළැස්විය යුතුය. ඒ සම්බන්ධයෙන් පශු වෛද්‍යවරයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක තීරණය වන්නේය. මෙසේ කිරීමේදී කිසියම් වන්දියක් ඉල්ලීමට කවර පාර්ශ්වයකට හිමිකමක් නොමැත.

27. සතුන් ඝාතනය කිරීම, හම ගැසීමේ හෝ මස් කිරීමේ ක්‍රියාවලිය අතරතුර ඝාතකයන් ඔවුන්ගේ සහායකයන් ඝාතකාගාරයට අනුයුක්ත ප්‍රාදේශීය සභා නිලධරයන් සහ බලයලත් අය හැර වෙනත් කිසිම තැනැත්තෙකු ඝාතකාගාර ස්ථානය තුළට ඇතුළත් කර නොගත යුතුය.

28. ඝාතකයන් හෝ ඔහුගේ සහායකයන් විසින් ඝාතකාගාරයේ දමා යන සියළු අවමස් හෝ වෙනත් කුණු කසල පීඩාවක් ඇති නොවන අතර බැහැර කළ යුතුය.

29. කිසියම් තැනැත්තෙකු විසින් කවර හෝ සතෙකුගේ මස් කිසිවක්, ඒ මස් හිරුඑළියෙන් දූවිල්ලෙන් සහ වැස්සෙන් සාර්ථකව ආරක්ෂා වන ආකාරයට සහ මහජනයාට නොපෙනෙන පරිදි ආවරණ සහිතව බාහිරට රැගෙන යාම කළ යුතුය.

30. ඝාතකාගාරය තුළ සතෙකු ඝාතනය කරන සෑම විටම වෙනත් කවර හෝ සතෙකුට නොපෙනෙන පරිදි සුදුසු ආවරනයන් යටතේ ඝාතනය කිරීම සිදු කළ යුතුය.

31. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසු හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල

"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද,
"බලය ලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,
''නිසි බලධාරියා'' යන්නෙන් සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ද,
''ඝාතකාගාර භාරකරු'' යනුවෙන් ඝාතකාගාරය භාරව කටයුතු කිරීමට පත්කළ අයෙකු හෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යන්නෙක්ද,
''අවමස්'' යන්නෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු මස් ද,
"සතුන්" යන්නෙන් ගෝඝාතක ආඥාපනතේ අර්ථ නිරූපණය ද අදහස් වේ.

**ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii)(ඇ)වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි බර සහ වේග සීමා නියම කිරීම හා එමගින් පාරකට හෝ මංමාවතකට ඇතිවිය හැකි හානි වැලැක්වීම හා අධික බර සහිත වාහන ගමනාගමනය පාලනය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර, වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි ප්‍රාදේශීය සභා විසින් කලින් කලට තීරණය කරනු ලබන මාර්ගයක හෝ මාර්ගයේ කොටසක ධාවනය කළ යුතු වාහනයක උපරිම බර, වේගය සභාව විසින් කලින් කලට යෝජනා සම්මතයක් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කිරීම නිත්‍යානුකූල වන්නේය.

5. ඉහත 4 වන වගන්තිය යටතේ සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා මාර්ගයක හෝ මාර්ගයක කොටසක ධාවනය කළ යුතු වාහනයක් උපරිම බර, උපරිම වේගය සභාපතිවරයා විසින් අදල මාර්ගයෙහි හෝ මාර්ගයේ කොටසේ සීමාවන්හි හෝ එම මාර්ගයට හෝ මාර්ගයේ කොටසට සම්බන්ධ වන වෙනත් මාර්ගයන් සම්බන්ධ වන ස්ථානයන්හි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මෙහි පහත උපලේඛනයේ සඳහන් කරනු ලබන ආකෘතියට අනුකූලව සකස් කර ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේය.

6. මෙහි ඉහත 5 වගන්තිය යටතේ ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක්ම මංමාවත් ආඥාපනතේ හා ගමනාගමන පනතේ විධිවිධානයන්ට අනුකූලව සකස් කර ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේය.

7. ඉහත 4 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන සෑම තීරණයක් ම පහත කරුණු සැලකිල්ලට ගනිමින් තීරණය කළ යුත්තේය.

   *(අ)* අදල මාර්ගයේ පළල
   *(ආ)* මාර්ග පෘෂ්ඨය ඉදි කර ඇති ද්‍රව්‍යවල ස්වභාවය හා ඝනකම
   *(ඇ)* මාර්ගයේ ආනත තලයේ බෑවුම් ස්වරූපය
   *(ඈ)* මාර්ගය ඉදිකර ඇති භූමියේ ස්වභාවය
   *(ඉ)* පාලම් සහ බෝක්කුවලට දැරිය හැකි බර ප්‍රමාණය
   *(ඊ)* ධාවනය වන වාහනවල ස්වභාවය

8. ප්‍රාදේශීය සභා මාර්ගයක ප්‍රතිසංස්කරණ කටයුත්තක් හෝ වෙනත් යම් කටයුත්තක් හේතු කොටගෙන මාර්ගය හෝ මාර්ගයේ කොටසක් වසා තබන්නේ නම් සභාපතිවරයා විසින් එසේ වසා තැබීම පිළිබඳ දැන්වීමක් වසා තැබීමේ දිනට දින තුනකට පූර්වයේ සිට අදල මාර්ගයට හෝ මාර්ගයේ කොටසට සම්බන්ධ වන වෙනත් මාර්ගයන්හි ප්‍රවේශ වන ස්ථානයන්හි ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේය.

9. ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා මාර්ගයක බර හා වේග සීමා තීරනය කර මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති විටකදී සීමා කරන ලද බර හා වේගය ඉක්මවන පරිදි වාහන ධාවනය කිරීම කවර තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතුය.

10. ප්‍රාදේශීය සභා මාර්ගයක මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බර, වේග සීමා තීරණය කර ඇති විටෙක එවැනි මාර්ගයකට හානි වන ආකාරයට කිසියම් ද්‍රව්‍යයක් ගෙනැවිත් දැමීම හෝ බැහැර කිරීම හෝ එක්රැස් කරන ජලය එම මාර්ගයට මුදා හැරීමට කටයුතු කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතුය.

11. ප්‍රාදේශීය සභා මාර්ගයක මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බර, වේග සීමා තීරණයකර ඇති විටෙක එවැනි මාර්ගයකට පවත්වාගත යුතු වේගයට බාධාවන ආකාරයෙන් මාර්ගය දෙපස කවර තැනැත්තෙකු විසින් හෝ යම් ගසක් හෝ ගසක කොටසක් හෝ මාර්ගයට නෙරා ඒමට සැලැස්වීම නොකළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ බර, වේග සීමා කරන ලද ප්‍රාදේශීය සභා මාර්ගයක් හෝ මාර්ගයක කොටසක් නිරන්තරයෙන් ව්‍යාපාර කාර්යයන් වෙනුවෙන් උපරිම බර රැගෙන යාම සඳහා යම් තැනැත්තෙකු විසින් භාවිතයට ගනු ලබන්නේ නම් එවැනි තැනැත්තෙකු සමග ප්‍රාදේශීය සභාව ඇති කර ගනු ලබන ගිවිසුමකට අනුව මාර්ගය හෝ මාර්ගයේ කොටසකට සිදු වන හානි පූර්ණයක් වශයෙන් සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයන් යටතේ මුදලක් සභාව විසින් අයකිරීම නිත්‍යානුකූල වන්නේය.

13. සභාපතිවරයා විසින් කිසියම් කාලසීමාවක් දක්වා අවස්ථානුගත කරුණු අනුව ප්‍රාදේශීය සභා මාර්ගයක් හෝ මාර්ගයක කොටසක් උපරිම බරක් රැගෙන යාම සීමා කිරීම සඳහා හෝ යම් මාර්ගයක හෝ මාර්ගයක කොටසක් වාහන ධාවනය සීමා කිරීම සඳහා හෝ එක් පසකට පමණක් ධාවනය කිරීම සඳහා හෝ එලෙස ධාවනයේදී පවත්වා ගත යුතු උපරිම වේගය ඉහත 4 වන වගන්තිය යටතේ තීරණය කරන ලද වේගය තවදුරටත් සීමා කිරීම සඳහා නියමයක් කිරීම නිත්‍යානුකූල වන්නේය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තව දුරටත් කරගෙන යන අවස්ථාවකදී ඒ පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධාරියා විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනයක් සඳහා නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ විධිවිධානයට අනුකූල විය යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ ධාවනය කරන වාහනයක උපරිම බර, වේගය තීරණය කරන ලද මාර්ගයක ධාවනය වන වාහනයක බර පරීක්ෂා කිරීම උදෙසා සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිසි හා යෝග්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම නිත්‍යානුකූල වන්නේය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස
"සභාව" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවද,
"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාව සඳහා තෝරාපත් කර ගනු ලැබූ සභාපතිවරයා ද,
"තැනැත්තෙකු" යන්නෙන් පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාගත ආයතනයක්,
"වාහනය" යන්නෙන් මෝටර් වාහන ආඥා පනත යටතේ දී ඇති අර්ථයමද,
"බර" යන්නෙන් වාහනය සහ වාහනයට පිටතින් පටවන ලද ද්‍රව්‍යයන්ද සහිතව ඇක්සලය මත යෙදෙන සම්පූර්ණ බර ද අදහස් වේ.

උපලේඛනය







03-223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.